

DMC
SRI LANKA

Disaster Management Centre
3rd, 4th Floor,
120/2, Vidya Mawatha,
Colombo 07

Ministry of Education

ISBN 978-955-674-142-1

අපි ආපදාවලින් වළකිමු



Ministry of Education

DMC
SRI LANKA
Disaster Management Centre

අපි ආපදාවලින් වළකිමු

පාසල් සිසු සිසුවියන් සඳහා
න්‍යාත්මක සහ ප්‍රායෝගික අත්දැකීම්
ඇසුරෙන් නිර්මිත අත් පොතකි.

Ministry of Education

Disaster Management Centre

අපි ආපදාවලින් වළකිමු

ISBN 978-955-674-142-1

පළමු මුද්‍රණය : 2019

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,
120/2, විද්‍යා මාවත,
කොළඹ 17.

මුද්‍රණය : Cyber Creation & Publishing Co. (Pvt) Ltd.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකතුමන්ගේ පණිවිඩය

ස්වාභාවික ආපදා රාශියකට ගොදුරුවීමේ හැකියාව පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව හඳුනාගෙන ඇති අතර ගංවතුර, නායයාම්, නියඟය, ගිනි ගැනීමේ වැනි ආපදා නිරන්තරයෙන් වාර්තා වේ. 2004 වර්ෂයේ ඇති වූ සුනාමි ආපදාව සමඟ විශාල දේපළ හා ජීවිත ප්‍රමාණයක් එකවිට රටට අහිමි වීමත් සමග ආපදා කළමනාකරණය සම්බන්ධ විශේෂ අවධානයට ලක්විය. ඒ හේතුවෙන් ආපදා කළමනාකරණ අමාත්‍යංශය සහ ආපදා කළමන-ාකරණ මධ්‍යස්ථානය ස්ථාපිත විය.

ස්වාභාවික හේතූන් නිසා මෙන් ම මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා ද ආපදා තත්ත්වයන් නිර්මාණය වන අතර, වැඩිවන ජනගහනය හා සීමිත සම්පත් හේතුවෙන්, ආපදා අවදානම් ප්‍රදේශවල ජනතාව ජීවත්වන ප්‍රවණතාවය ද වැඩිවේ. එමෙන් ම අවිධිමත් ඉඩම් පරිභෝජනය, පරිසර විනාශය, දේශගුණික වෙනස්වීම්, ආදී වූ හේතු රාශියක් ආපදා තත්ත්වය තීව්‍ර කිරීමට බලපාන අතර ආපදා අවදානම අවම කිරීම සඳහා ප්‍රජාව තුළ ඒ පිළිබඳ පවතින දැනුම ඉතාමත් වැදගත් වේ.

දැනුම වර්ධනය කිරීම සහ පරිසර හිතකාමී පුරුදු පුහුණු කිරීම ළමා වයසේ සිට සිදුවිය යුතු අතර, ඒ තුළින් ආපදා අවදානම් අවම කිරීම ප්‍රජාවගේ ජීවිත තුළට බද්ධ කිරීමට හැකිවනු ඇත. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දරණ ලද එක් ප්‍රයත්නයක් ලෙස මෙම ග්‍රන්ථය හැඳින්විය හැකි අතර මේ තුළින් පාසල් සිසු සිසුවියන්ට ආපදා අවදානම් තක්සේරුකරණය පිළිබඳවත්, මූලික ආපදා කළමනාකරණ සංකල්ප පිළිබඳවත් අවබෝධයක් ලබාගත හැකිවනු ඇතැයි අපේක්ෂා කරමි.

ඩබ්ලිව්. ඒ. ධර්මසිරි
අධ්‍යක්ෂ ජනරාල්,
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ පණිවිඩය

ගංවතුර, නියඟය, සුළිකුණාටු, භූමිකම්පා, ගිනිකඳු යනාදී ස්වාභාවික සංසිද්ධීන් මානව ඉතිහාසය පුරාම සිදු වී ඇත. එසේ වුවද, සීඝ්‍ර ජනගහන වර්ධනය, පාරිසරික දූෂණය සහ වර්ධනය වෙමින් පවතින දිළිඳුකම යනාදී කරුණු හේතුකොට ගෙන සිදුවන, මෙම ස්වාභාවික සංසිද්ධීන් මිනිස් ජීවිත විශාල වශයෙන් බිළිගනිමින් පොදු සහ පෞද්ගලික දේපළ විනාශයට පත්කරන ආපදාවන් බවට පත්ව ඇත.

ස්වාභාවික ආපදා තත්ත්ව හේතුකොට ගෙන දශකයක් පාසා ලෝක ජනගහනයෙන් මිලියනයක් මියයති. තවත් මිලියන කිහිපයක් අවතැන් වූවන් බවට පත්වෙති. ස්වාභාවික විපත් නිසා ආර්ථිකමය වශයෙන් සිදුවන අලාභය පසුගිය වසර 30ක කාලය තුළ දී තුන්ගුණයකින් වර්ධනය වී ඇත. ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේද පිළිබඳව ජනතාව අතර දැනුවත්භාවය වර්ධනය කොට අඛණ්ඩව හා සාමූහිකව ක්‍රියා කිරීම තුළින් ආපදා තත්ත්වයන් හි බලපෑම අවම කළ හැකි වේ. එසේ කිරීමෙන් මාතෘ භූමියේ ජීවනාවලිය වන ළමා පරපුරේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් වැදගත් කාර්යයභාරයක් ඉටුකළ හැකි බැවින්, ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට ඇතුළත් කිරීමේ වැඩසටහන යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව ප්‍රාථමික අධ්‍යාපනයෙහි නිරත පාසල් දරුවන්ට ආපදා අවදානම් කළමනාකරණය සම්බන්ධව මූලික දැනුම ලබා ගැනීමේ ක්‍රමවේදයක් ලෙස පිළියෙල කර ඇති මෙම පොත ඒ සඳහා මනා පිටුවහලක් වනු ඇත.

ආර්. එම්. එම්. රත්නායක
අතිරේක ලේකම්
(පාසල් අධ්‍යාපන කටයුතු),
අධ්‍යාපන අමාත්‍යාංශය.

තිරසාර දියුණුවක් සඳහා ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට ඇතුළත් කිරීමේ කාලීන අවශ්‍යතාවය මත පදනම්ව " **ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනය ප්‍රධාන ප්‍රවාහය තුළට ඇතුළත් කිරීම** " සඳහා වන ප්‍රධාන වැඩසටහන යටතේ, ආපදා අවදානම් අවම කිරීම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට ඇතුළත් කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. ඒ යටතේ වයස 12 න් පහළ පාසල් ළමුන්ට ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ මූලික දැනුම ලබා දීම සඳහා මෙම පොත නිර්මාණය කොට ඇත.

එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර උපාය මාර්ග සංවිධානය හා එක්සත් ජාතීන් ගේ ළමා අරමුදල මඟින් ඉදිරිපත් කොට ඇති මෙවලම් කට්ටලය පාදක කොටගෙන ශ්‍රී ලංකාවේ ආපදාවන්ට හා සමාජයට ගැලපෙන ලෙස මෙම පොත නිර්මාණය කොට ඇති අතර, ඒ සඳහා දායකත්වය දක්වන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ ඒ. ඩී. එම්. ඩී. බණ්ඩාර (අධ්‍යාපන අධ්‍යක්ෂ, විෂය සමගාමී මාර්ග උපදේශනය) අධ්‍යාපන අමාත්‍යාංශයේ පද්මශාන්ත (සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ) යන මහත්වරුන්ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඩබ්. ඒ. ධර්මසිරි (අධ්‍යක්ෂ ජනරාල්), එස්. ආර්. ආර්. පී. සමරකෝන් (සහකාර අධ්‍යක්ෂ) ඒ. එම්. ආර්. කේ. රත්නායක (සහකාර අධ්‍යක්ෂ) ඇතුළු අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශයේ සියලුම කාර්ය මණ්ඩලය ද ස්තූති පූර්වක සිහිපත් කරමි.

අනෝජා සෙනවිරත්න
අධ්‍යක්ෂ (අවමකිරීම, පර්යේෂණ හා සංවර්ධන අංශය)
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.

අවදානම ගැන ඉගෙන ගනිමු !

ස්වභාව ධර්මය ජීවයේ ප්‍රභවය වේ.

මානව සංහතිය ස්වභාව ධර්මයේම කොටසකි. ජීවිතයේ ගුණාත්මකභාවය අප විසින් අන් සියලුම ජීවීන් සමඟ මෙම පෘථිවිය බෙදා හදාගන්නා ආකාරය මත රඳා පවතී. අපගේ යහපැවැත්ම ස්වභාව ධර්මය මත රඳා පවත්නා බැවින්, ස්වභාව ධර්මය ආරක්ෂා කිරීම අප සැමගේ යුතුකම වේ.

ස්වභාව ධර්මය නිරතුරුවම ක්‍රියාශීලී ලෙස වෙනස් වෙමින් පවතී. මෙය තීව්‍ර ආකාරයකින්ම සිදුවේ. වර්ෂාපතනය, සුළඟ, භූචලන හා ස්වභාවිකව සිදුවන පාංශු ඛාදන වැනි සංසිද්ධීන් නිදසුන් ලෙස ගත හැකිය.

භූචලන, ජල ගැලීම්, ලැව්ගිනි, ගිනිකඳු(යමහල්) පිපිරීම්, කුණාටු, ටොර්නේඩෝ, අකුණු, නාය යාම්, නියඟ, වසංගත සහ එල්නීනෝ හා ලා නීනා වැනි වෙනත් සංසිද්ධීන් ද හිරු පෑයීම හා වර්ෂාව මෙන් ස්වභාව ධර්මයේ ක්‍රියාකාරීත්වයන් වේ.

මෙම ස්වභාවික සංසිද්ධීන් සමස්ත පෘථිවියටම බලපෑම් ඇති කරයි. ඈත අතීතයේ මෙම සංසිද්ධීන් විස්තර කිරීමට අපේ මුතුන්මිත්තෝ ජනප්‍රවාද ඉදිරිපත් කළහ. මුහුද ගොඩගලා සුනාමි ඇතිවූ විට එය දේව කෝපයක් ලෙස හැඳින්විය. යමහල් පිපිරීමක් සිදු වූ විට, භූමිය කෝපවී බිල්ලක් ඉල්ලා සිටින බව ඔවුහු විශ්වාස කළහ. එහෙත් අද විද්‍යාව, තාක්ෂණය හා ඉතිහාසය මෙම සංසිද්ධීන් නිසි ලෙස තේරුම් ගැනීමට සහ ඒවාට බිය නොවීමට අපට කරුණු පෙන්වා දෙයි.

එසේ වුවද, මෙම සංසිද්ධීන් අද දරුණු අවදානම් බවට පරිවර්තනය වී ලෝකයේ සෑම ප්‍රදේශයකම සිටින ජනයා වෙත අලාභ හානි සිදු කරයි. ආපදා වැළැක්වීමේ සංස්කෘතියක් නොමැති වීම සහ එහි පවත්නා අඩුලුහුඬුකම් ඒ සඳහා හේතුපාදක වේ.

උපද්‍රවයක් යනු කුමක්ද?

උපද්‍රවයක් යනු, ආරක්ෂක පියවර නොගතහොත් පුද්ගලයන් හා ඔවුන්ගේ දේපළට හා පරිසරයට හානි සිදු කළ හැකි ශක්තියක් ගැබ්වූ ස්වභාව ධර්මය නිසා හෝ මිනිස් ක්‍රියාකාරීත්වයන් නිසා හෝ සිදුවන සංසිද්ධියක් හෝ ක්‍රියාවලියකි.

විවිධ උපද්‍රව වර්ග තිබේ. ප්‍රධාන වශයෙන් ස්වාභාවික උපද්‍රවයන් සහ මිනිස් ක්‍රියාකාරීත්වයන් නිසා සිදුවන උපද්‍රවයන් ලෙස වර්ග දෙකකට වෙන්කළ හැක.

විවිධාකාර ස්වාභාවික උපද්‍රවයන් අතර අපට පහත සඳහන් උපද්‍රවයන් හඳුනා ගත හැක.

භූමි කම්පා, භූ චලන :
පෘථිවි අභ්‍යන්තරයේ ගැඹුරේ සිට හට ගන්නා චලනයන් නිසා පෘථිවිය මතුපිට සිදුවන ඉතා බරපතළ සෙලවීම් හෝ ගැස්සීම්, මේවා නිසා විශාල හානි සිදුවිය හැක.

ගිනි කඳු (යමහල්) :
පෘථිවි අභ්‍යන්තරයේ ගැඹුරේ සිට මතුපිටට පැමිණෙන ලාවා, අළු හා විෂ ගෑස් යමහල් මුඛයෙන් පිටවීමේ දී පිපිරීම් සිදු වේ.

නායයාම් හා මඩ ගැලීම් :
පස් හා ගල් කැබලි සෙමෙන් සෙමෙන් හෝ සීඝ්‍රයෙන් බෑවුම් දිගේ පහළට තල්ලුවීම, මේවා වැඩි වශයෙන්ම සිදු වන්නේ වර්ෂා කාලවලදී හා භූමි කම්පාවලදීය.

සුනාමි :
භූකම්පන නිසා හෝ යමහල් පිපිරීම් නිසා හෝ සාගර පතුලේ නායයෑම් නිසා යෝධ රැල්ලක් හෝ රැලි මාලාවක් වෙරළ මත ඉතා තදින් පතිත වීම.

"හරිකේන්" කුණාටු :
සාගරය මතුපිටින් ආරම්භ වී, විශාල වෘත්ත මෙන් කැරකැවෙමින් ගමන් කරන වේගවත් සුළං විශේෂයකි. මේවා තද වැසි ගෙනේ. නිවර්තන සුළි සුළං ලෙස ද හැඳින්වේ.

කෘමි/සත්ත්ව උවදුරු :
සමහර විට කෘමීන් හෝ වෙනත් සත්ත්ව විශේෂයන් විශාල රංචු වශයෙන් ගම්, නියම්ගම් ආක්‍රමණය කර, එහි ගස්වැල් හා බෝග සම්පූර්ණයෙන්ම විනාශ කර දමනු ලැබේ.



නියඟ :
විශාල ප්‍රදේශයක් තුළ දීර්ඝ කාලයක් (මාස ගණනාවක් හෝ වසර කීපයක්) මුළුල්ලේ වැසි නොලැබීම නිසා නියඟය ඇතිවේ. නියඟයන් නිසා ප්‍රදේශයේ පස, වගාවන්, සතා සිවුපාවන් හා පුද්ගලයන්ට ද විශාල පාඩු සිදුවේ.

ගංවතුර :
බොහෝ විට තද වර්ෂාපතනය හේතුවෙන්, පොළවට උරා ගැනීමට නොහැකි තරම් ජලය එක් රැස්වීමෙන් ජලගැලීම් සිදුවේ.

ලැව්ගිනි :
වෘක්ෂලතා ආදිය ආවරණයෙන් යුක්තවූ වනාන්තරවල ඇති වන විනාශකාරී ගිනි ඇවිලීම්. මෙම ගිනි පාලනය කර ගැනීමට නොහැකිව විශාල ප්‍රදේශ හරහා පැතිරිය හැක.

"ටෝර්නාඩෝ" කුණාටු :
පුනීල හැඩයක් සහිතව පොළව මතුපිට කර කැවෙමින් ගමන් ගන්නා ඉතා ප්‍රචණ්ඩ සුළං විශේෂයකි.

මෙම උපද්‍රව අවදානමක් බවට පෙරළිය හැක. එහෙත් එසේ වන්නේ යම් යම් කරුණු අනුවයි. එම කරුණු මොනවාදැයි දන්නෙහි ද?

ආපදාවක් යනු කුමක්ද?

ආපදාවක් සිදුවීමට ;

- ස්වභාවිකව හෝ මිනිස් ක්‍රියාකාරීත්වය නිසා හෝ උපද්‍රවයක් සිදුවීම
- ක්‍රියාකාරී යමහලක් අසල හෝ නායයෑම් සිදුවිය හැකි කඳුබෑවුම්වල හෝ පිටාරගැලිය හැකි ගංගා අසල වැනි අවදානම් ස්ථානවල ජනයා පදිංචිව සිටීම හෝ රැස්වී සිටීම හෝ එම උපද්‍රවයට නිරාවරණය වන දේපළ පැවතීම
- එම උපද්‍රවය නිසා මිනිසුන් සහ දේපළවලට විශාල අලාභහානි සිදුවීම (සාමාන්‍ය ජන ජීවිතය අඩාලවන පරිදි සහ එම අලාබ හානිය ඇතිවූ පද්ධතියට දරාගත නොහැකිව, ඒ සඳහා බාහිර පාර්ශවවලින් උදව් ලබාගැනීමට සිදුවීම)

ආපදා සිදුවන්නේ මිනිසුන් නිසා ද? ස්වභාව ධර්මය නිසාද?

ආපදා වැළැක්වීමේ පියවර ගෙන නොතිබේ නම් හෝ යම් මිනිස් ක්‍රියාකාරීත්වයක් තුළින් ස්වභාවික පරිසරයට හානියක් සිදු වී තිබේ නම් හෝ පරිසර පද්ධතියේ අසමතුලිතව තිබේ නම් හෝ ස්වභාවික සංසිද්ධීන් හි ශක්තිය අධිකවීම තුළ එය ඉතා ප්‍රචණ්ඩ බවට පරිවර්තනය වී ආපදා සිදුවිය හැක.

නිදසුන් දැක්වුවහොත්, පසට උරාගත නොහැකි තරම් ජලය කෙටි කාලයක් තුළ අධික වර්ෂාපතනය ලෙස ලැබීමෙන් ජලගැලීම් සිදුවේ. සමහර ප්‍රදේශවලට ජලය ලැබීම බොහෝ දුරට අඩුවුවහොත් නියඟයන් ඇති වේ. ගස් කපා දමා, අළුතින් ගස් සිටුවීමට අතපසු කිරීම වැනි ක්‍රියාවන් මඟින් මිනිසුන් විසින් මෙවැනි තත්ත්වයන් තව තවත් උත්සන්න කරනු ලැබේ.ගස් කපා දැමීම නිසා පස වියලී දූවිලි බවට පත් වේ. එවිට, සුළඟ මඟින් පාංශු ඛාදනය සිදු වේ. වර්ෂාව ඇද හැලෙන විට, පස බැඳ තැබීමට තරම් වෘක්ෂලතාදිය හෝ මුල් නොමැති නිසා පාංශු ඛාදනය මෙන්ම නායයෑම් සිදුවිය හැක.

බොහෝ ලැව් ගිනි සෘජුවම හෝ වක්‍ර වශයෙන් සිදු කෙරෙන්නේ මිනිසුන් විසිනි. ගොවියෝ බොහෝ විට වගා කටයුතු ආරම්භ කිරීමට පෙර වල්පැළෑටි ඉවත් කිරීම සඳහා ඔවුන් තෝරා ගත් බිම්වලට ගිනි තබති. එවැනි ගිනි පාලනය කළ නොහැකි වී සමහර විට පැතිරී යයි. තවත් සමහරු අපරීක්ෂාකාරී ලෙස ක්‍රියා කරමින් විනෝද කඳවුරු අතහැර යෑමට පෙර තමන් සෑදූ ගිනි ගොඩවල් සම්පූර්ණයෙන් නිවා දැමීම අතපසු කරති. විශාල ලැව් ගින්නක් ආරම්භ වීමට අවශ්‍ය වන්නේ කුඩා ගිනි පුපුරක් පමණකි.

කොරල් පර, වනාන්තර හා කඳුකර ප්‍රදේශවල වැවෙන ඉතා සියුම් පැළෑටි වර්ග වැනි ස්වභාවික සම්පත් අප විසින් විනාශ කරන ලදහොත්, සුනාමි, නියඟයන්, නායයෑම්, ජලගැලීම් හා වෙනත් උපද්‍රවවලට ගොදුරුවීමේ ප්‍රවණතාවය වැඩිවේ.

එල් නීනෝ, යනු කුමක් ද?

"එල් නිනෝ" යනු සාමාන්‍ය කාළගුණ රටාවේ සිදුවන වෙනස්කම් හැඳින්වීමට යොදා ගන්නා පදයකි. එය චක්‍රීය වශයෙන් සිදුවේ. එනම් සිංහල අළුත් අවුරුද්ද යනාදී අවස්ථාවන් මෙන්, එය කාලීනව පැමිණෙයි. එසේ වුවත් එය සෑම වසරකදීම සිදු නොවේ. නියමිත දිනයක ආරම්භ නොවේ."එල් නීනෝ" කාළගුණය හට ගන්නේ සාමාන්‍යයයෙන් නත්තල් කාලයේදීය. "එල් නීනෝ" යන නම ඊට පට බැඳුනේ ඒ නිසාය. "එල් නීනෝ" යන පදයේ නියම අර්ථය "නත්තලේ දී උපන් ජේසු බිළිඳා" යනුයි. මෙම නම කුඩා දරු දැරියන් හා සම්බන්ධ නැත.

පීරු දේශයේ හා ඉක්වදෝරය අසළ පැසිෆික් සාගරයේ ජලය සාමාන්‍ය උෂ්ණත්වයට වඩා උණුසුම් වූ විට. "එල් නීනෝ" සංසිද්ධිය හට ගනී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලතින් ඇමරිකාවේ හා ලෝකයේ වෙනත් ප්‍රදේශවලද ජලගැලීම්, නියඟ, ලැව් ගිනි හා වෙනත් ආපදා සිදුවිය හැක.

"එල් නීනෝ" සංසිද්ධියට ප්‍රතිවිරුද්ධ වෙනත් සංසිද්ධියක් ද විද්‍යාඥයන් විසින් පසුව සොයා ගන්නා ලදී. "ලා නීනා" නොහොත් "කුඩා දැරිය" වශයෙන් එය නම් කෙරිනි. "එල් නීනෝ" ජලය වඩා උණුසුම් කරන අතර. "ලා නීනා" ජලය වඩා සිසිල් කරයි.

ගංවතුරක, භූවලනයක, ටෝර්නාඩෝ, කුණාටුවක තීව්‍රතාව හා ප්‍රමාණය මනින්නේ කෙසේ ද?

ගංවතුර : ගංවතුර විවිධ මට්ටම්වලින් වාර්ෂිකව, වසර 25 කට වරක්, වසර 50 කට වරක් සහ වසර 100 කට වරක් ආදී ලෙස හඳුනාගැනේ. ගංවතුරවල තීව්‍රතාවය ජලමට්ටමේ උස, ගලාබස්නා ජල ධාරිතාවය මත රදාපවතී.

රික්ටර් පරිමාණය : භූචලනයක ප්‍රමාණය - එනම්, භූ චලයකින් නිකුත් වන ශක්තිය - මැනීමට රික්ටර් පරිමාණය යොදා ගැනේ. මෙතෙක් වාර්තා වී ඇති ඉතාම බිහිසුණු භූ චලන මෙම පරිමාණයේ 9 දක්වා ඇත.

සංශෝධිත මර්කල්ලි පරිමාණය : මෙම පරිමාණය යොදා ගැනෙන්නේ භූ චලනයක තීව්‍රතාවය හෝ කම්පනය ගණනය කිරීමටය. එනම්, භූචලනයේ ප්‍රතිඵලය හෝ ඉන් සිදුවන හානිය ගණනය කිරීමටය. මෙම පරිමාණය 1 සිට 11 දක්වා විහිදේ.

ෆුජිටා පරිමාණය : "ටෝර්නාඩෝ" කුණාටු වර්ග කිරීම සඳහා මෙම පරිමාණය යොදා ගැනේ. එය **F0,F1,F2,F3,F4** හා **F5** වශයෙන් ටෝර්නාඩෝ වර්ග කරයි.

සෆීර් - සිම්සන් පරිමාණය : සුළඟේ වේගය අනුව "හරිකේන්" කුණාටු වර්ග කිරීම සඳහා මෙම පරිමාණය යොදා ගැනේ. 1 වන වර්ගය : පැයට කිලෝමීටර 119-153, 2 වන වර්ගය: පැ/කි 154-177,3 වන වර්ගය : පැ/කි 178-209, 4 වන වර්ගය : පැ/කි 210 - 249, 5වන වර්ගය : පැ/කි 250 හා ඊට වැඩි

දේශගුණික වෙනස්වීම ගැන ඔබ අසා ඇත. ඔබ අසනීප වූ දිනක ඔබේ ශරීරයේ උෂ්ණත්වය ඉහළ යන ලෙසට පෘථිවියේ උෂ්ණත්වය ඉහළ යෑමෙන් පෘථිවියේ පාරිසරික පද්ධතියට කුමක් සිදුවේද?

ගෝලීය උණුසුම පිළිබඳ අධ්‍යයනය කරන පුද්ගලයන් පවසන පරිදි හරිතාගාර වායූන් (**Greenhouse gases**) ප්‍රමාණය ඉහළ යාම සඳහා මිනිසාවන අප වගකිව යුතු වේ. හරිතාගාර ආවරණය යනු පෘථිවිය මත ජීවය පැවතීම සඳහා අවශ්‍යවන ස්වාභාවික සංසිද්ධියකි. හාරිතාගාර ආවරණය සිදු නොවන විටදී පෘථිවියේ උෂ්ණත්වය පහත යන අතර, එවැනි අවස්ථාවක ජීවීන් හට නොගනී.

හිරු කිරණ ලෙස පෘථිවියට පැමිණෙන සූර්ය ශක්තිය මඟින් පෘථිවිය උණුසුම් කරයි. සූර්ය කිරණවලින් කොටසක් පෘථිවිය වායුගෝලයට පරාවර්තනය කරන අතර, කොටසක් පෘථිවි මතුපිට මඟින් උරාගන්නීය. තවත් කොටසක් පැතිරී යාම මඟින් නිල් පැහැති ආකාශය ඇති කරයි.

පෘථිවිය මඟින් උරාගන්නා ශක්තියෙන් කොටසක් පිටත වායුගෝලයට පරාවර්තනය කරයි. මෙම ශක්තිය රඳවා ගැනීමේ ස්වාභාවික සිද්ධිය හරිතාගාර ආවරණය ලෙස හඳුන්වයි. හරිතාගාර වායුන්වන කාබන්ඩයොක්සයිඩ්, මීතේන්, නයිට්‍රස් ඔක්සයිඩ්, ජලවාෂ්ප, ඕසෝන් ආදිය මෙම ශක්තිය උරාගැනීමට පොරවනයක් මෙන් ක්‍රියාකරන අතර, එමඟින් පෘථිවියේ උෂ්ණත්වය රඳාවාගනී

මෙම උෂ්ණත්ව සංතුලනය පෘථිවිය තුළ ජීවය ඇතිවීමට මෙන්ම පෘථිවියෙහි ජලය පැවතීමටද හේතුවේ. මෙම මූලධර්මය හරිතාගාර තුළ බෝග වගා කිරීමට ද භාවිත කරයි. ප්‍රධානතම හරිතාගාර වායුව වන කාබන්ඩයොක්සයිඩ් (**CO_2**), වායු ගෝලයේ ඇති හරිතාගාර වායුන් සමතුලිතව පවත්වාගෙන යයි. උදාහරණයක් ලෙස කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩිවුවහොත් සමතුලිතභාවය බිඳී යයි. මෙම කාබන්ඩයොක්සයිඩ්හි වැඩිවීම හරිතාගාර ආවරණය ඉහළ යන අතර, පෘථිවියේ උෂ්ණත්වය සාමාන්‍ය අගයට වඩා ඉහළ යයි. එවිට සමතුලිතතාවය බිඳ දමමින් ගෝලීය උණුසුම ඇතිවීමට මඟ සලසයි. ගෝලීය උණුසුම තවත් පාරිසරික ප්‍රශ්නයක් වන සාමාන්‍ය උෂ්ණත්වය වෙනස් වීම හෙවත් දේශගුණික වෙනස්වීමට මඟපාදයි.



වායු ගෝලයේ කාබන්ඩයොක්සයිඩ් වැඩිවීමට වගකිව යුත්තේ කවුරුන්ද..?

වර්තමාන මිනිස් ක්‍රියාකාරකම්, වන විනාශයට ප්‍රධාන හේතුව ලෙස හඳුනාගන ඇත. එසේම ඩීසල්, පෙට්‍රල්, ගල් අඟුරු වැනි පොසිල ඉන්ධන දහනය කරන අතර මෙම පොසිල ඉන්ධන දහනය කරන විට කාබන්ඩයොක්සයිඩ් පරිසරයට නිදහස් වේ. ගුවන්යානා, රථවාහන ආදිය සඳහා ශක්තිය නිපදවීමට මෙන්ම කර්මාන්ත ශාලාවල යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට මෙම පොසිල ඉන්ධන භාවිතා කරනු ලබයි.

පර්යේෂකයින්ට අනුව දේශගුණික විපර්යාසය මඟින් විශාල ලෙස බලපෑම් ඇතිකරනු ලබයි. උෂ්ණත්වය වැඩිවීමෙන් අයිස් කඳු දියවීමත් උණුසුම නිසා ජල මට්ටම ඉහළ යාමත් අපේක්ෂා කරයි. බෝගවල අස්වැන්න අඩුවීමත්, විවිධ ස්ථානවල වර්ෂාව හා නියඟය වැඩිවීමත් විශාල ලෙස තාප තරංග ඇතිවීමත් ජලය හිඟ වීමත් සිදු වේ. පරිසර පද්ධතීන්හි සිදුවන අසමතුලිතතාවය නිසා වසංගත මෙන්ම බෝවන රෝගවල වැඩිවීමත් අපිට අපේක්ෂා කළ හැක.

අපිට අවශ්‍ය වෙනස සිදුකිරීමට කළ හැකි දේ .....

- දේශගුණික විපර්යාස හා එහි අහිතකර බලපෑම් පිළිබඳව ඔබේ යහළුවන් හා පවුලේ අය සමඟ කථා කරන්න.
- අහිතකර බලපෑම් පිළිබඳ ඔබේ ගුරුතුමාගෙන් අසා දැන ගන්න.
- අපිට අවශ්‍ය ප්‍රමාණයට පමණක් ශක්තිය පරිභෝජනය කිරීමට පුරුදු වන්න.
- ප්ලාස්ටික් නිෂ්පාදන නැවත නැවත පරිහරණය කරන්න.
(ඒවා දිරාපත් වීමට වසර 500ට වඩා ගත වේ)
- ගස් සිටවන්න - ශාක මඟින් කාබන්ඩයොක්සයිඩ් අවශෝෂණය කරයි.
- ඔබට බයිසිකලයක් ඇත්නම් නිතර එය පාවිච්චි කරන්න. විශාල ලෙස පරිසරයට කාබන්ඩයොක්සයිඩ් නිදහස් කරන ප්‍රවාහන මාධ්‍යය යොදා ගැනීමට ඔබට අවශ්‍යය නොවනු ඇත.
- ජලය සීමිත සම්පතකි. ජලය පරිස්සමින් භාවිත කරන්න. මේ වන විටත් සමහර රටවලට ජල හිඟ ඇති වී ඇත.

හිස්තැන් පිරවීමෙන් ඔබට පාංශු ඛාදනය ගැන වැඩි විස්තර දැනගත හැකිය. එක් එක් වචනයට අයත් වෙනම වර්ණයක් ඇත. එම වචනය වමේ සිට දකුණට සහ උඩ සිට පහළට දක්වා ඇත.

1. අධික වර්ෂාව, සුළඟ හෝ අවිධිමත් ලෙස භූමිය පරිහරණය කිරීම (පරිසරය, ගහ කොළ විනාශ කරමින් පොළොවට හානි වන ලෙස කටයුතු කිරීම) දිගින් දිගටම සිදුවීම හා සිදුකිරීම හේතුවෙන් මෙය සිදු වේ. ______

2. ______ හෝ ______ විසින් සිදු කරන ______ හේතුවෙන් සෝදා පාළුව සිදු වේ.

3. අධික වර්ෂාව හේතුවෙන් පොළොවෙහි ______ ඉවත් වී යාම ද සෝදා පාළුවට හේතු වේ.

4. පස ආරක්ෂා කිරීමට සහ සෝදා පාළුව පාලනය කිරීමට නැවත ______ සිදු කළ හැක.



රූපයට අදාලව හිස් තැන් පිරවීමෙන් ඔබට බාදනයට හේතුව හඳුනාගත හැකිවනු ඇත.



☆ ☆ ☆ ☆ ☆ විනාශ කිරීම.

මෙම චිත්‍රයේ අකුරු විශාලම අකුරේ සිට කුඩාම අකුර දක්වා අනුපිළිවෙලට සකස් කරන්න. අනතුරුදායක ස්ථානවල පිහිටීම නිසා ප්‍රජාවන් විනාශ කළ යම් උපද්‍රයක් ඉන් දැක්වේ.



ගොදුරු වීමේ හැකියාව යනු කුමක්ද ?

උපද්‍රවයකින් බේරීමේ නොහැකියාව හෝ විපතක් සිදු වූ විට ඊට නිසිලෙස ප්‍රතිචාර දැක්වීමේ අපහසුතාව හේතුවෙන් ආපදාවට ලක්වීමේ සම්භාවිතාව ගොදුරු වීමේ හැකියාව වශයෙන් හැඳින්වේ.

නිදසුනක් දැක්වුවහොත්, ජල ගැලීම් සළකා බලන විට තැනිතලාවල පදිංචි ජනයාගේ ගොදුරු වීමේ හැකියාව උස්බිම්වල පදිංචි අයගේ ගොදුරු වීමේ හැකියාවට වඩා අධික වේ. ප්‍රායෝගික සාධක සළකා බලන විට, පුද්ගලයන්ගේ වයස හා සෞඛ්‍ය තත්ත්වය, ප්‍රදේශයේ පාරිසරික හා සෞඛ්‍ය ආරක්ෂක තත්ත්වය, උපද්‍රවයන්ට සාපේක්ෂව ප්‍රදේශයේ ගොඩනැගිලිවල පිහිටීම හා ඒවායේ තත්ත්වය වැනි විවිධ සාධක ගොදුරු වීමේ හැකියාව වෙත බලපෑම් ඇති කරයි.

ගොදුරු වීමේ හැකියාව ඉහළ යා හැකි ක්‍රියාවන්

ආපදාවලට ගොදුරුවීමේ හැකියාව වැඩි කිරීමට හේතුවන කරුණු ගණනාවක් ඇත. ගස් නැවත වැවෙන වේගයට වැඩි වේගයකින් ඒවා කපා දැමීම එක් නිදසුනකි. මෙය වන විනාශය ලෙස හැඳින්වේ. වන විනාශය හේතු කොටගෙන, වැස්ස නිසා සිදුවිය හැකි හානිවලට අපට මුහුණ දීමට සිදුවන අවස්ථාව වැඩිවේ. ගහ කොළ නැති පොළවට වැස්ස වැටුණු විට ජල ගැලීම්, නායයාම්, ගංවතුර සිදුවේ.

ආපදා සිදුවිය හැකි ස්ථානවල නිවාස සෑදීමෙන් ගංවතුරට ගොදුරුවීමේ හැකියාව වැඩිවේ. අප විසින් ගංගාවක් අසළ පදිංචි වී සිටිමින් ගංගා ජලය ගලා යාම වළක්වමින් ගඟට කුණු කසල යනාදිය එක් කළහොත් ජලගැලීම්වලට අප ගොදුරු වීමට ඇති හැකියාව බෙහෙවින් වැඩිවේ.

- ගොදුරු වීමේ හැකියාව සඳහා පිහිටීම සාධකයක් වේ. ආදායම් අඩු පවුල් බොහෝ විට නගරවල අවදානම අධික ස්ථානවල පදිංචි වී සිටිති. මක්නිසාද යත් ආරක්ෂාකාරී ස්ථාන ඉතා මිල අධික වේ.

- එමෙන්ම ආපදාවට නිරාවරණතාවය ද සාධකයක් වේ. මෙහිදී ආපදාවට නිරාවරණය වන කාලය සහ ප්‍රදේශය ආදී කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

ආපදාවන්ට ගොදුරුවීමේ හැකියාව අඩුකර ගත හැක්කේ කෙසේ ද?

ගොඩනැගිලිවල ශක්තිය වැඩි කිරීම:
සෑම පාසලක්ම ආරක්ෂිත විය යුතුයි. පාසලේ ගොඩනැගිලි ආපදාවන්ට ඔරොත්තුදෙන ලෙසට ශක්තිමත්ව ඉදිකල යුතුය.

ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ දැනුවත් වීම:
ආපදා අවදානම් අවම කිරීම පාසල් විෂය මාලාව යටතේ ඉගැන්වීමේ දී පරිසරය සමඟ සහයෝගීව ජීවත්වීමටත්, ප්‍රධාන අවදානම් මඟහැරීමටත් ආපදාවක දී තමන් පවුලේ අය හා ඔවුන්ගේ ප්‍රජාව ආරක්ෂා කර ගැනීමටත් ළමුන්ව දැනුවත් කළ යුතුයි.

අවදානමක් යනු කුමක්ද?

අවදානමක් යනු උපද්‍රවයක් විපතකට පරිවර්තනය වී නිරාවරණයවන වස්තූන්ට හානි සිදුකිරීමයි. ගොදුරුවීමේ හැකියාව හෝ උපද්‍රවය වෙන් වෙන් වශයෙන් ගත් විට භයානක නොවේ. එහෙත් ඒ දෙකම එක් වූ විට අවදානමක් ඇතිවේ. එනම්, ආපදාවක් සිදුවීමෙන් හානි සිදුකළ හැකිය.

එසේවුවද, අවදානම අඩු කළ හැක. පාලනය කළ හැක. අප පරිසරය ආරක්ෂා කිරීමට පියවර ගන්නේ නම් සහ පවත්නා උපද්‍රවයන්ට සාපේක්ෂව අපගේ දුර්වලතා හා ගොදුරු වීමේ හැකියාව ගැන අප දැනුවත්ව සිටී නම් උපද්‍රවයන් ආපදාවක් බවට පෙරළීම වැළැක්වීමේ පියවර අපට ගත හැකි වේ.

අවදානම් පාලනය කිරීමෙන් ආපදා වැළැක්විය හැකිවනු පමණක් නොව, තිරසාර සංවර්ධනයටද දායක විය හැකි වේ.

දිගුකාලීනව පරිසරයට හෝ අනාගත පරම්පරාවන්ට හෝ හානියක් සිදු නොවන ආකාරයට, සුවදායක හා ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට හැකි වන ලෙස අපගේ ජීවිකාව ගෙන ගිය හැකිය.

පරිසරයට හානිවන ආකාරයට වර්තමානයේ කටයුතු කරමින් ජීවත් වුවහොත් අනාගතයේ නිසැකවම අපට ආපදාවන් සඳහා මුහුණ දීමට සිදුවනු ඇත.

පහත අවස්ථාවන් වලින් ආරක්ෂිත හා අනාරක්ෂිත අවස්ථා මොනවද ?





විපත් වැළැක්වීම හා අවදානම අවම කිරීම යනු කුමක්ද?

විපතක් සිදු නොවන බවට වග බලා ගැනීමට ගන්නා සියළුම පියවර ආපදා වැළැක්වීම වන අතර විපතක් ඇත්ත වශයෙන්ම සිදුවුවහොත්, ඉන් සිදුවන හානිය අවම කර ගැනීමට ගන්නා සියළුම පියවර ආපදා අවම කිරීම ලෙස හැඳින්වේ. බොහෝ ස්වාභාවික සංසිද්ධීන් සිදුවීම අපට වැළැක්විය නොහැක. එහෙත් ඒවායින් සිදුවිය හැකි හානිය අවම කරගත හැක. නිදසුනක් සළකා බැලුවහොත්, භූමිකම්පාවක් අපට වැළැක්විය නොහැක, නමුත්, නිවාස ශක්තිමත්ව ගොඩනැගීමෙන් හා ඒවා ස්ථාවර භූමි ප්‍රදේශයක ගොඩ නැගීමෙන් භූමිකම්පාවෙන් සිදුවන අලාභ හානි අඩුකර ගත හැක.

වැළැක්වීම යනු කුමක්ද? යම් සිද්ධියක් විපතක් බවට පත් නොවීමට ක්‍රියා කිරීම වැළැක්වීමයි. නිදසුනක් නම්, ගස් සිටුවීමෙන් ඛාදනය හා නායයෑම් වළක්වා ගත හැක. එමෙන්ම නියඟයෙන් ද වැළකිය හැක. ගංගා ආසන්නව නිවාස ඉදි නොකිරීමෙන් ගංවතුරෙන් වැළකිය හැක.

අවම කිරීම යනු කුමක්ද? යම් යම් උපද්‍රවයන් සම්බන්ධයෙන් අපගේ ගොදුරුවීමේ හැකියාව සමනය කිරීමට පියවර ගැනීම අවම කිරීම යනුවෙන් හැඳින්වේ. භූ චලනයක් මඟින් හෝ "හරිකේන්" කුණාටුවකින් කඩා බිඳ නොවැටෙන ලෙස නිවාස, පාසැල් හා රෝහල් නිර්මාණය කිරීමේ තාක්ෂණික ක්‍රම දැන් ඇත.

වැළැක්වීම හා සමනය කිරීම සඳහා අවශ්‍ය කරුණු:

- අප ජීවත්වන ප්‍රදේශය ආශ්‍රිතව ඇතිවිය හැකි උපද්‍රවයන් හා අවදානම් ගැන අවබෝධයෙන් සිටීම.
- එම උපද්‍රවයන් හා අවදානම් අවම කිරීමටත්, ඒවායින් අපට සිදුවිය හැකි හානි වැළැක්වීමටත්, අපගේ පවුල් හා අසල්වැසියන් සමඟ එක් වී සැලසුම් කිරීම සහ ඒ සඳහා තාක්ෂණික දැනුම ඇති අයගේ උපදෙස් ලබාගැනීම.
- අපගේ ගොදුරුවීමේ හැකියාව අවම කිරීම සඳහා අප සූදානම් කළ සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.
- සාකච්ඡා කිරීමට පමණක් සීමා නොවී, ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම.

අපට විපතක් වැළැක්විය හැකිද?

ස්වාභාවික සංසිද්ධීන් සිදුවීම අපට වැළැක්විය නොහැක. එසේ වුවද, ඒවා සිදුවන්නේ කුමක් නිසාදැයි සහ ඒවා වැළැක්වීම හෝ සමනය කිරීමට කුමක් කළ හැකි දැයි අප වඩා හොඳින් අවබෝධ කර ගතහොත්, ඒවායේ විනාශකාරී බව අඩු කර ගැනීමට අපට හැකි වේ.

විපත් සිදුවීම ගැන මිනිස් වර්ගයා ද වගකිව යුතු හෙයින්, ස්වාභාවික සංසිද්ධීන්ගේ අහිතකර බලපෑම් වැළැක්වීමට හෝ අවමය කර ගැනීමට නම් අපගේ යම් යම් වැරදි ක්‍රියා අප විසින් වෙනස් කරගත යුතු වේ.

පාරිසරික සම්පත් භාවිතය පිළිබඳ සෑම ප්‍රජාවක්ම දැනුවත් විය යුතුයි. පරිසරය ගැනත් ඊට ආවේණික වූ ලක්ෂණ ගැනත්, එනම් ස්වාභාවික පරිසරය හා මිනිසා විසින් නිර්මිත පරිසරය ගැනත් දැනුවත් විය යුතුය. තමන් වටා ඇති උපද්‍රව පාලනය කළ හැකි හා එම උපද්‍රවයන් පිළිබඳ තමන්ගේ ගොදුරු වීමේ හැකියාව අවමය කළ හැකි එකම මාර්ගය එසේ දැනුවත් වීම සහ ඒ සඳහා ක්‍රියාත්මක වීමයි.

බිය නොවන්න! සූදානම්ව සිටින්න!

ඔබ ජීවත් වන ප්‍රදේශයේ අතීතය ගැන දැනුවත් වන්න. ඔබේ දෙමාපියන්, ඔවුන්ගේ දෙමාපියන් හා ඔබගේ මිතුරු මිතුරියන් යම් විපතකට භාජනය වූයේ දැයි ඔවුන්ගෙන් අසා දැන ගන්න. එම විපත සිදුවූයේ කෙසේද? මිනිසුන් විසින් කළ නොයුතුව තිබූ යම් දෙයක් ඔවුන් විසින් කරන ලද්දේ ද? තත්ත්වය යහපත් අතට හැරවීම සඳහා ඔවුහු කුමක් කළෝද?

බෙදා හදා ගන්න, එකමුතු වන්න, විපත් හා විපත් වැළැක්වීම ගැන තව තවත් ඉගෙනීමට පුවත්පත්, ගුවන්විදුලිය හා රූපවාහිනිය ඔබට ප්‍රයෝජනවත් වේ. පාසැල් ක්‍රියාකාරකම් ද ඔබට උපකාරීවනු ඇත. ඔබට ඉගෙනගත් දේ ගැන චිත්‍ර ඇඳීමෙන්, විපත් හා විපත්වලින් වැළැක්වීම ගැන වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට හා ඒවා ගැන වෙනත් අයට ඉගැන්වීමට ඔබට හැකිවනු ඇත. ඔබ ප්‍රජාව තුළ අවදානම් අවමය කරගත හැකි ක්‍රම ගැන ඔබගේ පවුලේ අය සමඟ, මිතුරු මිතුරියන් සමඟ හා දන්නා හඳුනන අය සමඟ කතා බහ කරන්න.

සූදානම්ව සිටින්න, ඔබේ පවුලේ සාමාජිකයන් සමඟ එක්ව, ආරක්ෂා සහිත ස්ථාන හඳුනා ගන්න. හදිසි අවස්ථා සැලැස්මක් සූදානම් කර තබා ගැනීමේ වැදගත්කම ගැන ඔබේ දෙමාපියන් හට කරුණු පහදා දෙන්න. ඔවුන් සමඟ එක්ව හදිසි අවශ්‍යතා කට්ටලයක් පිළියෙල කරන්න.

ඔබ මේ කරුණු දැන සිටියා ද..........?

පැරණි සම්භවයන්ගෙන් පැවත එන ස්වදේශීය ප්‍රජාවන්ට ස්වභාව ධර්මය පූජනීය වේ. මක්නිසාද යත්, ස්වභාව ධර්මය තුළ දෙවිවරුන් වෙසෙන බවත්, එම දෙවිවරුන් වෙත පුද පූජා පැවැත්විය යුතු බවත්, ඔවුහු විශ්වාස කරති.

ස්වභාව ධර්මයේ, වනාන්තරවල විල්, පොකුණු, ආදියේ පූජනීයභාවය ගැන ස්වදේශීය ප්‍රජාවන් විශ්වාස කළ නිසා, වනාන්තර කපා දැමීම, පරිසරයට හානිවන ලෙස නිවාස සෑදීම වැනි පරිසරයට හානිකර දේ කිරීමෙන් ඔවුහු වැළැකී සිටියහ. මෙම සංකල්පය අද භූමි පරිභෝජන කළමනාකරණය යනුවෙන් හැඳින්වේ.

ප්‍රදේශයක ඒ ඒ ස්ථාන වල කුමක් කළ හැකි ද? කුමක් කළ නොහැකි ද යනු තීරණය කෙරෙන්නේ භූමි පරිභෝජන කළමනාකරණ නීති අනුවය.

ඔබගේ අවට සිටින අයගේ දැනුම වැඩිකරන්න සහයවන්න.

විපත් වැළැක්වීමේ අවශ්‍යතාව ගැන ඔබ සමඟ සහ අවට සිටින පිරිස් වල දැනුවත් බව වර්ධනය කිරීම පිළිබඳව ඔබට ද වැදගත් වැඩ කොටසක් පැවරේ. ආපදා මඟින් ඔබගේ ප්‍රජාව වෙත ඇති කළ හැකි අයහපත් බලපෑම් අවම කිරීමට ඔබට කළ හැකි දේවල් ගැන නිදසුන් කිහිපයක් පහත සඳහන් වේ.
මේවා ඔබේ ගුරුතුමා/තුමිය සමඟ පංතියේ දී සාකච්ඡා කරන්න

අනතුරුදායක ස්ථාන හඳුනා ගන්න....

අවදානම අධික නිසා පදිංචි වීම අනතුරුදායක ස්ථාන ඔබ අවට තිබේ නම්, ඒවා ගැන ඔබ දන්නෙහිද? ඔබ ගුරුතුමාගේ හෝ ගුරුතුමියගේ ආධාර ලබාගෙන, ඔබ පංතියේ යහළුවන් සමඟ එක්ව අවදානම් ස්ථාන ඇතුළත් සිතියමක් අඳින්න. අවදානම් අවමය කිරීම සඳහා කළ හැකි දේ ගැන සාකච්ඡා කරන්න. (අවදානම් සහිත ස්ථාන පෙන්වන සිතියමක් ගැනත්, එම සිතියමක් අඳින සැටිත්, ඉදිරි පිටුවක සඳහන් වේ.)

වැළැක්වීමේ වැඩසටහන් සංවිධානය කරන්න....

ගංගාවලට එකතුවන ලෙස කසළ දැමුවහොත් කුමක් සිදුවේ ද ? ගංගා ජලය දූෂණය වී සතුන් හා පැළෑටි මිය යා හැක. තවද, ජල ගැල්මක් වුවද ඇති විය හැක. ඔබත්, ඔබේ මිතුරු මිතුරියන් ද එක් වී, ගුරුතුමාගේ/තුමියගේ සහාය ලබාගෙන ඔබ ප්‍රදේශයේ ගංගා පිරිසිදු කිරීමේ වැඩසටහනක් ඔබට සමහර විට සංවිධානය කළ හැකිවේ.

ස්වාභාව ධර්මය ආරක්ෂා කිරීමට අන් අය පොළඹවන්න....

ඉහත පෙන්වා දුන් පරිදි, ගස් කැපීම නිසා වර්ෂාව හා නායයෑම් මඟින් විපත් සිදුවිය හැක. එහෙයින් පාසලේ හා ප්‍රජාව තුළ පැළ සිටුවීමේ ව්‍යාපාර දියත් කළ හැක. එසේ කිරීමෙන්, ස්වාභාව ධර්මය ආරක්ෂා කිරීමටත්, නායයෑම් හා පාංශු ඛාදනය වැළැක්වීමටත්, වෙනත් විනාශකාරී ප්‍රතිඵල වැළැක්වීමටත් හැකි වනු ඇත.

යා කිරීමෙන් උගනිමු !

වම් පස ප්‍රශ්න හා ප්‍රශ්නයට අදාළ චිත්‍ර සපයා ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු චිත්‍රය දකුණු පස වැරදි අනුපිළිවෙළට සපයා ඇත. එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු චිත්‍රය තෝරා, ප්‍රශ්නය චිත්‍රය හා පිළිතුරු චිත්‍රය රේඛාවකින් යා කරන්න.

යමහලක් (ගිනි කන්දක්) පුපුරයි, ඉන් බලපෑමට ලක්විය හැකි (ගොදුරු වීමේ හැකියාව ඉතා අධික) ප්‍රජාව කුමක් ද?

නායයෑම්වලට මග පාදන එක් මිනිස් ක්‍රියාකාරීත්වයක් පෙන්වන්න



ගංගාවේ ජල මට්ටම සීඝ්‍රයෙන් ඉහළ යන බව මේධාවී දකියි. නිලධාරීන් විසින් කුමක් කළ යුතු ද ?

තමන්ගේ ප්‍රජාව තුළ ඇති උපද්‍රවයන් ගැන දැනුම වර්ධනය කර ගැනීම සඳහා මෙම දරු දැරියන්ට කළ හැකි වැළැක්වීම් වැඩසටහන කුමක් ද ?

ආ ! ! ! පොළොව සෙලවෙනවා ! පොළොව සෙලවීම අවසන්වන තුරු හරේන් සිටිය හැකි අවදානම අඩුම තැන කුමක් ද ?

එක් එක් චිත්‍රයට ගැලපෙන වචනය තිරස් කොටුවල ලියන්න

පෘථිවි අභ්‍යන්තරයේ ගැඹුරේ සිට හට ගන්නා චලනයන් නිසා පෘථිවිය මතුපිට සිදුවන ඉතා බරපතළ සෙලවීම් හෝ ගැස්සීම්, මේවා නිසා විශාල හානි සිදුවිය හැක.

පෘථිවි අභ්‍යන්තරයේ ගැඹුරේ සිට මතුපිටට පැමිණෙන ලාවා, අළු හා විෂ ගෑස් යමහල් මුඛයෙන් පිටවීමේ දී සිදු වේ.

පස් හා ගල් කැබලි සෙමෙන් සෙමෙන් හෝ සීඝ්‍රයෙන් බෑවුම් දිගේ පහළට තල්ලුවීම, මේවා වැඩි වශයෙන්ම සිදු වන්නේ වර්ෂා කාලවලදී හා භූමිකම්පා වලදීය.

භූකම්පන නිසා හෝ යමහල් පිපිරීම් නිසා හෝ සාගර පතුලේ නායයෑම් නිසා යෝධ රැල්ලක් හෝ රැලි මාලාවක් වෙරළ මත ඉතා තදින් පතිත වීම.

සාගරය මතුපිටින් ආරම්භ වී, විශාල වෘත්ත මෙන් කැරකැවෙමින් ගමන් කරන වේගවත් සුළං විශේෂයකි. මේවා තද වැසි ගෙනේ. නිවර්තන සුළි සුළං ලෙස ද හැඳින්වේ.

සමහර විට කෘමීහු හෝ වෙනත් සත්ත්ව විශේෂයෝ විශාල රංචු වශයෙන් ගම්, නියම්ගම් ආක්‍රමණය කර, එහි ගස්වැල් හා බෝග සම්පූර්ණයෙන්ම විනාශ කර දමති.



විශාල ප්‍රදේශයක් තුළ දීර්ඝ කාලයක් (මාස ගණනාවක් හෝ වසර කීපයක්) මුළුල්ලේ වැසි නොලැබීම. මේ නිසා ප්‍රදේශයේ පස, වගාවන්, සතා සිවුපාවන් හා පුද්ගලයන්ට ද විශාල පාඩු සිදුවේ.

බොහෝ විට තද වර්ෂාපතනය හේතුවෙන්, පොළවට උරා ගැනීමට නොහැකි තරම් ජලය එක් රැස්වීමෙන් මෙය සිදුවේ

පුනීල හැඩයක් සහිතව පොළව මතුපිට කර කැවෙමින් ගමන් ගන්නා ඉතා ප්‍රචණ්ඩ සුළං විශේෂයකි.

වෘක්ෂලතා ආදිය ආවරණයෙන් යුක්තවූ වනාන්තරවල ඇති වන විනාශකාරී ගිනි ඇවිලීම්. මෙම ගිනි පාලනය කර ගැනීමට නොහැකිව විශාල ප්‍රදේශ හරහා පැතිරිය හැක.

ප්‍රදේශය තුළ අවදානම් සහිත ස්ථාන පෙන්වන සිතියම්:

අනතුරු හඳුනාගෙන සූදානම් ව සිටින්න!

විපතක් සිදුවීමට පෙර, ඊට ඔබත් ඔබගේ පවුලත් ඔබගේ මිතුරු මිතුරියන්ගේත්, දේපළවල හා ජීවිතවල පාත්‍රතාව (ආපදාවට ලක්වීමට ඇති හැකියාව) අවමය කිරීමට ඔබට කුමක් කළ හැකි ද? විපතක් සිදුවීමේ අවදානම ඔවුනට අවබෝධ කර දීමෙන් විපත වැළැක්වීමට පියවර ගැනීම සඳහා ඔවුනට උපකාර කිරීමට ඔබට හැකිය. එසේ කළ හැකි හොඳම ක්‍රමය නම් ප්‍රදේශයේ උපද්‍රව හා අවදානම් ස්ථාන පෙන්වන සිතියමක් සකස් කර, එය ප්‍රදර්ශනය කිරීමයි.

අවදානම් පෙන්වන සිතියමක් යනු, විපතක් සිදුවුවහොත්, ඉන් අයහපත් බලපෑමට හසුවිය හැකි පාසැල්, රෝහල්, වගාබිම්, මාර්ග යනාදි ප්‍රධාන ස්ථාන පෙන්වන ප්‍රදේශයේ විශාල චිත්‍රයකි. එය ඔබට ඔබගේ ගුරුතුමාගේ/තුමියගේ සහාය ලබාගෙන ඔබේ පංතියේ යහළුවන් සමඟ සකස් කළ හැක. සමීපයේ පිහිටි ජල ගැල්මට යටවිය හැකි ප්‍රදේශ, ගිනි ඇවිලිය හැකි වියළි තණබිම් වැනි උපද්‍රව සහිත ස්ථාන, නායයාමේ අවදානමක් ඇති ස්ථාන, සිතියමේ දක්වා තිබිය යුතුය. ඊට අමතරව, ගිනි නිවන හමුදා මුරපොල, වෛද්‍යන මධ්‍යස්ථාන, පාසල්, ආගමික සිද්ධස්ථාන වැනි පෙර සූදානම් වීමට හා ආරක්ෂා වීමට උපකාරී වන ස්ථාන යනාදිය ද සිතියමට ඇතුළත් කළ යුතු ය. මෙම ස්ථාන පෙන්වීම සඳහා සිතියමේ සංකේත යෙදිය හැක. අනෙක් අයට තේරුම්ගත හැකිවන පරිදි ඔබ විසින්ම සකස් කර ගත් සංකේත වුවද යොදා ගැනීමේ වරදක් නැත.

අවදානම් සහිත ස්ථාන පෙන්වන සිතියම්වල අරමුණ කුමක් ද?



ඔබගේ ප්‍රදේශයේ පවතින උපද්‍රව හා අවදානම් හඳුනා ගැනීමටත්, යම් උවදුරක් ඇත්ත වශයෙන්ම සිදුවුවහොත්, එය විපතක් බවට පෙරළීම වළක්වා ගැනීමට හෝ එහි විනාශකාරීභාවය අවම කර ගැනීමටත් මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. අවදානම් අධික ප්‍රදේශ තුළ පිහිටි (නිදසුනක් වශයෙන් නායයෑම්වලට) ගොදුරු විය හැකි පාසැල් හා වෙනත් ප්‍රධාන ගොඩනැගිලි මේ සිතියම් පෙන්වයි. සිදුවිය හැකි හදිසි අවස්ථාවකට සූදානම් වීමට ද අවදානම් ස්ථාන පිළිබඳ සිතියම් අපට උපකාරී වේ.

නිදසුන් ලෙස ප්‍රදේශයෙන් පිටවීමට උපදෙස් දෙන ලද අවස්ථාවකදී වඩාත්ම ආරක්ෂාකාරී පිටවීම් මාර්ග හා ආරක්ෂාකාරී ගොඩනැගිලිවල පිහිටීම මෙම සිතියම්වල දැක්වේ. මෙලෙස හදිසි අවස්ථාවක දී, ඔබ කළ යුතු දේ මෙම සිතියම් නිසා ඔබට පහසුවෙන් තීරණය කළ හැකි වේ.

ක්‍රියාකාරිවන්න ඔබගේ ප්‍රදේශයේ අවදානම් ස්ථාන දැක්වෙන සිතියමක් සකස් කරන්න!

ඔබේ ගුරුතුමාගේ/තුමියගේ සහයෝගය ලබාගෙන මෙම වචනවල තේරුම් දැන ගන්න. ආපදාව, අවදානම, ආපදා පාත්‍රතාව හෙවත් ගොදුරුවීමේ හැකියාව (පාරිභාෂිත පද මාලාවේ දක්වා ඇත. ඔබ මෙතෙක් කියවා ඇති කොටස්වල ද මෙම වචන වල තේරුම් දක්වා ඇත).

- මෙම ප්‍රදේශයේ කුමන විපත් සිදු වී තිබේ ද? කවදා ද? ඒ අවස්ථාවලදී සිදු වුයේ කුමක් ද?
- ප්‍රදේශවාසීහු ඒ අවස්ථාවේදී කුමක් කළෝ ද?
- එවැනි විපතක් අනාගතයේදී සිදුවීම වැළැක්වීමට කුමක් කළ යුතු ද? ප්‍රජාව තුළ කුමන පුද්ගලයන්ගේ සහ කුමන ආයතනවල සහාය ලබා ගත හැකි ද?

වඩාත්ම වැදගත් ගොඩනැගිලි ලකුණු කරන්න. පාසැල්, නගර ශාලාව, රෝහල්, ගිනි නිවන හමුදා කාර්යාලය, පොලිසිය හා නිවාස. තවද, කර්මාන්තශාලා ගංගා හරහා දමා ඇති වේලි, විදුලි බල උත්පාදන යන්ත්‍රාගාර හා අළුත් වැඩියා නොකර දුර්වල තත්ත්වයේ පවතින ගොඩනැගිලි වැනි අනතුරු සහිත ස්ථාන ලකුණු කරන්න. එක් එක් ගොඩනැගිලි වර්ගය සඳහා වෙන් වෙන් සංකේත යොදන්න. සියළුම මංමාවත්, ගංගා, විදුලිබල රැහැන් මාර්ග, ජල පද්ධති, මාර්ග, කසළ දමන බිම් ලකුණු කරන්න. මේ එක් එක් දේ දැක්වීමට වෙනස් වර්ණ යොදන්න.

ඒ ඒ ගොඩනැගිලි කොතෙක් දුරට බලපෑමට යටත් වේ දැයි (ස්වල්ප වශයෙන්, විශාල වශයෙන්, සම්පූර්ණයෙන් විනාශ වීම) දක්වන්න. වෙනස් වර්ණ භාවිතා කිරීමෙන් අවදානම් ප්‍රමාණය දැක්විය හැක. විපතක් සිදුවුවහොත්, උපකාර වඩාත්ම අවශ්‍ය ජනයා පදිංචි තැන් ලකුණු කරන්න (පාසැල්, වැඩිහිටි නිවාස, රෝහල් හා පෙර පාසැල්).

ප්‍රජාව තුළ අවදානම් අවමය කරගත හැකි හා විපත් වළක්වා ගත හැකි විවිධ උපක්‍රම සාකච්ඡා කරන්න. ඔබ මුණ ගැසීමට ගිය අසල්වාසීන් ඔබට දුන් තොරතුරු ඔබ ගුරුතුමා/තුමිය වෙත හා ඔබ පන්තියේ මිතුරු/මිතුරියන් වෙත දන්වන්න. ජනතාව වඩාත් සුරක්ෂිත කිරීම සඳහා ප්‍රජාවට කුමක් කළ හැකි ද? ප්‍රදේශයේ කිනම් අයගේ ආධාරය ඒ සඳහා ලබා ගත හැකි ද?

ඔබගේ ප්‍රජාවේ විවිධ පුද්ගලයන්ට ඔබේ පාසලට පැමිණෙන ලෙස ආරාධනා කරන ලෙස ඔබගේ ගුරුතුමාට/ තුමියට කියන්න. ප්‍රාදේශීය සභා සභාපතිවරයා, නගරාධිපතිවරයා, ගිනි නිවන හමුදා ප්‍රධානියා, පොලිස් පරීක්ෂක, පුවත්පත් වාර්තා කරුවන්, වෛද්‍යවරුන්, කාළගුණ විද්‍යාඥයින් හා සමාජ සේවා නිලධාරීන් යනාදී පුද්ගලයින්ට ඔබේ පාසලට ආරාධනා කළ හැක. ඔවුන් සමඟ කතාබහ කරමින් ඔබ දන්නා තොරතුරු සහ ඔබේ අදහස් ඔවුන් වෙත දන්වා සිටින්න.



සූදානම් වන්න හදිසි අවස්ථා කට්ටලයක් පිළියෙල කරන්න!

හදිසි අවස්ථාවකදී අවශ්‍ය දෑ ඇතුළත් හදිසි අවස්ථා කට්ටලයක් සෑම නිවසකම තිබිය යුතුය. භූ චලනයක් හෝ කුණාටුවක් වැනි උපද්‍රවයක් සිදුවුවහොත්, විදුලි බලය ඇණ සිටිය හැක නැතහොත් ජලය අපවිත්‍ර විය හැක. කුණාටුවක් නිසා හෝ ජල ගැල්මක් නිසා, දින ගණනක් ඔබට නිවසටම වී සිටීමට සිදුවිය හැක. ආපදාවට ගොදුරු වුවහොත් කඳවුරු ගතවීමටද සිදුවිය හැක. එවැනි තත්ත්වයක් ඇතිවුවහොත්, හදිසි අවස්ථා කට්ටලයක් තිබීම ඉතා ප්‍රයෝජනවත් වේ. සමහර විට ඔබට හෝ ඔබේ පවුලේ අයට එම කට්ටලය කිසි දිනක පාවිච්චි කිරීමට අවස්ථාවක් නොඑනු ඇත. එසේ වුවද හදිසි අවස්ථා කට්ටලයක් තබා ගැනීම නුවණට හුරුය. ඔබගේ දෙමාපියන්ගේ ද ආධාරය ලබාගෙන හදිසි අවස්ථා කට්ටලය සකස් කරන්න. හදිස්සියකදී එය පහසුවෙන් සොයාගත හැකි වන පරිදි සියලූම දේ තනි ප්ලාස්ටික් උරයක බහා තබන්න හදිසි අවස්ථා කට්ටලයට පහත සඳහන් දේ අඩංගු විය යුතුය.

1. ප්‍රථමාධාර කට්ටලය

මෙයට කපු පුළුන්, වෙළුම් පටි, සැරහුම් (ග්‍රෝස්, රෙදි), වේදනානාශක, ඖෂධ, ජීවානුහරණ ජලය, පිළිස්සුම් ආලේපන යනාදිය අඩංගු විය යුතුය. වෙනත් කුමන දේ ඇතුළත් විය යුතු දැයි ඔබ ප්‍රදේශයේ වෛද්‍ය මධ්‍යස්ථානයෙන් විමසා දැන ගත හැක.

2. ආහාර පාන ආදිය

නරක් නොවන ආහාර වර්ග තබා ගැනීම නුවණට හුරුය. ටින් කරන ලද, පැකට් කරන ලද ආහාර, බිස්කට් වැනි ශීතකරණයේ තැබීම අනවශ්‍ය ආහාර තෝරා ගත යුතුය. දින තුනකට පමණ ප්‍රමාණවත් ආහාර තබා ගත යුතුය. පිසීම අවශ්‍ය නොවන ආහාර වඩාත් සුදුසු වේ. ටින් විවෘත කරන උපකරණය අමතක නොකරන්න. බීමට ජලය හා එය පවිත්‍ර කිරීමට ක්ලෝරීන් ද අමතක නොකරන්න.

3. ඇඳුම් පැළඳුම්

පවුලේ සෑම කෙනෙක්ටම අමතර ඇඳුම් කට්ටලයක් ගෙන යා යුතුය. වතුරට ඔරොත්තු දෙන පාවහන් යුගලක් හා වැහි කබායක් ද අවශ්‍ය වේ. එළිමහනේ නිදා ගැනීම අවශ්‍ය විය හැකි නිසා බිලැන්කට් පොරවන ද අඩංගු විය යුතුය.

හදිසි ආපදා කට්ටලයට දැමිය හැකි වෙනත් දෑ

විදුලි පන්දමක් (අමතර බැටරි සමඟ) පෑන්, පැන්සල් හා ලියන කඩදාසි, අතේ ගෙන යා හැකි ගුවන් විදුලි යන්ත්‍රයක්, සබන් ආදිය.

කට්ටලයට ඇතුළත් කළ දේ කලින් කලට පරීක්ෂා කර බලා, ඒවා නිසි ක්‍රියාකාරී තත්ත්වයෙන් පවතින බව සහතික කර ගැනීම වැදගත්ය. ටින් ආහාරවල කල් ඉකුත් වීමේ දිනය ගැන සැළකිලිමත් වන්න.

ඔබට ද අවශ්‍ය දේ හදිසි අවස්ථා කට්ටලයට එක් කළ හැක. එනම්, ක්‍රීඩා භාණ්ඩයක්, පෑන්, පැන්සල් හා ඔබ විශේෂයෙන් කැමති යම් දෙයක්,

මේ හැරුණු විට, ඔබට ඊට එක් කිරීමට කැමති දෑ තිබේද?

විපතක් සිදු වූ විට කෙබඳු හැඟීම් ඇති විය හැකිද?

පහත සඳහන් කරුණු මතක තබා ගන්න.

- විපත් සිදු වී ටික කලකට පසු සියලුම දේ නැවතත් යථා තත්ත්වයට පැමිණේ.
- විපත් සිදු වීම දේව කෝපයක් නොවේ.
- දින ගණනකට ඔබගේ නිවසට ආපසු යාමට නොහැකි වුවත් කාලය ගත කිරීම සඳහා යමක් කිරීමට ඔබට හැකිවනු ඇත. ඔබට අලුත් තැනක් හා අලුත් මිතුරු මිතුරියන් හඳුනා ගැනීමට හැකි වේ.
- ඔබ සිත තුළ බියක් සැකයක් තිබේ නම් වැඩිහිටියන්ගේ උපකාරය ලබා ගන්න. සිදු වන්නේ කුමක්ද පැහැදිලි කිරීමට ඔවුනට හැකිවනු ඇත. කඳවුරේ කොපමණ කාලයක් ගත කරන්නට සිදු වේද නැතහොත් ඔබට නැවත පාසල් යාමට හැකි වන්නේ කවදාටද යන ආදි ප්‍රශ්න ඔවුන්ගෙන් ඇසීමට බිය නොවන්න.

- විපතට පසු සමහර විට සෑහෙන කාලයක් ආරක්ෂාකාරී කඳවුරක නැවති සිටීමට ඔබට සිදු විය හැක. කඳවුර තුළ රෝග හා හදිසි අනතුරු වැළැක්වීම වැදගත් නිසා නිතරම සුද්ද පවිත්‍රව සිටීමට, නිතර නිතර අත් සොදා ගැනීමට, වැසිකිළි භාවිතා කිරීමට, මැසි මදුරුවන් හා මීයන් වැනි සතුන් වැළැක්වීම සඳහා කුණු කසළ වැළලීමට හා අනතුරුදායක ස්ථානවලින් ඈත් වී සිටිමට මතක තබා ගන්න.

- සිදුවුයේ කුමක් දැයි ලිවීම හෝ චිත්‍රයට නැඟීම සමහර විට ප්‍රයෝජනවත් වේ. සිදු වූ දේ පැහැදිලිව විස්තර කරන්න. ඔබේ හැඟිම් ගැනද සඳහන් කරන්න. එසේ ලියා තිබීම හෝ චිත්‍රයට නැඟිම තුළින් සිදු වූ දේ හොඳින් මතක තබා ගැනීමට ඔබට හැකි වේ. ඔබගේ නිර්භීත භාවය අන් අයට පෙන්වීමට ද එය ප්‍රයෝජනවත් ය.

- සිදු වූ විපත සම්බන්ධයෙන් හැඬීමට හා කඳුළු හෙළීමට ඔබ කැමති නම්, එසේ කිරීමේ කිසි වරදක් නැත. තත්ත්වය ඉක්මණින් යහපත් අතට හැරෙන බව ඒ සමඟම මතක තබා ගන්න.

- මේ අතර, කඳවුර තුළ ඔබට ද කළ හැකි කාර්යයන් බොහෝ ඇත. සෑම වයසකම දරු දැරියන් හට තමන්ට වඩා බාල දරුදැරියන් රැකබලා ගැනීමටත්, ඔවුන් හා ක්‍රීඩා කිරීමටත් පුළුවන. කුණාටුවක්, භූ චලනයක් වැනි විපතකට පසු නිවසේදී වුවද, අස්පස් කිරිමෙන්, අතුපතු ගෑමෙන් හා ශුද්ධ කිරීමෙන් ඔබගේ උපකාරය ලබාදිය හැක.

ඔබගේ හැඟීම් කලාත්මකව ප්‍රකාශ කරන්න !

විපතක් පිළිබඳ ඔබගේ හැඟිම් පද්‍ය, ගීත හා චිත්‍ර තුළින් ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වන්න. ඒවා තුළින් ප්‍රදේශයේ මිතුරු මිතුරියන් වෙත පණිවිඩයක් දී ඔවුන්ගේ දැනුවත් බව වර්ධනය කළ හැක.

පරිසරය පිළිබඳ ගීතයක් හෝ කවියක් නිර්මාණය කිරීමට උත්සාහ කරන්න

ලොව වටා සිටින ළමුන් ඔවුන්ගේ සිතුම් පැතුම් චිත්‍රය මගින් ද විදහා දක්වයි

විපත් ගැන සාකච්ඡා කළ හැකි විධි කිහිපයක්.

1. විපතක් නිරූපණය කරන චිත්‍රයක් අඳින්න.
   විපත සිදුවූයේ කෙසේ ද ?
   ජනතාව කුමක් කළෝ ද ?
   ඔබ එහි සිටියේ නම්,
   ඔබ කුමක් කරන්නෙහි ද?
   ඔබගේ චිත්‍රය පන්තියට පෙන්වන්න.

2. ඔබත් ඔබගේ මිතුරු මිතුරියන් සමඟ එක්ව,
   විශාල පුවරු චිත්‍රයක් සකස් කරන්න.
   එහි කුමක් ඇතුළත් කළ යුතු දැයි පළමුව තීරණය කරන්න.
   එය සියළු දෙනාටම බලාගත හැකි ස්ථානයක එල්ලා තබන්න.

3. ඔබගේ මිතුරු මිතුරියන් සමඟ එක් වී,
   මෑත දී සිදුවූ විපතක් ගැන පින්තූර පොතක් සකස් කරන්න.
   විපතට පෙර, විපත් අවස්ථාවේ දී හා ඉන් පසුව පුද්ගලයන් කුමක් කළේ දැයි
   එම පින්තූරවලින් දක්වන්න.



ඔබ ජීවත්වන ප්‍රජාව තුළ විපත් අවදානම අවමය කළ හැකි ක්‍රමයක චිත්‍රයක් අඳින්න.

ඔබ මුහුණදෙන ආපදා චිත්‍රයට නගන්න. ඔබගේ සිතුවිලි හැඟුම් ඔබට දැනෙන සියල්ල චිත්‍ර මඟින් ප්‍රකාශනය කරන්න. එසේ නිර්මාණය කරනු ලබන චිත්‍ර මේ සමග පැවැත්වෙන චිත්‍ර තරඟ සඳහා ඉදිරිපත් කළ හැක.

ක්‍රියාකාරීවන්න.!

ඔබගේ හා ප්‍රජාවගේ විපත්වලට ගොදුරු වීමේ හැකියාව අවම කිරීම සඳහා ඔබට කළ හැකි දේවල් චිත්‍රයක් මඟින් පෙන්වන්න.





නිවැරදි පාර තෝරා ගනිමු.

1. ජල ගැල්මට භාජනය වූ ජනයාට ආධාර කිරීමට යාම සඳහා එහි යාමට සූදානම් වන ජීවිත බේරා ගැනීමේ කණ්ඩායමට නිවැරදි මාර්ගය පෙන්වා දෙන්න.



හදිසි අවස්ථාවකදී, ඊට පෙර හා පසු ආධාර ලබාදෙන ආයතන හයක් ලකුණු කරන්න.

1. .... 4. ....

2. .... 5. ....

3. .... 6. ....

ආපදා අවදානම් වළක්වා ගැනීම හා ආපදාවන් මගහැරීමට පාසලේදී හා ඉන් පිටතදී ඔබට කළහැකි දේ.......

පරිසරය වැඩි දියුණු කිරීමට, සංරක්ෂණයට හා ආරක්ෂා කිරීමට ව්‍යාපාර සංවිධානය කිරීම:

නුසුදුසු ස්ථානවල කැළිකසල බැහැර කිරීමෙන් ගංගා, මුහුදු හා සාගර දූෂණයට ලක්වේ. භූමිය මත මෙන්ම ජලයේ ජීවත්වන සතුන් මෙන්ම ශාකද විනාශයට පත් වේ. නගරවල ටොෆි කොළ, ප්ලාස්ටික් බෝතල් වැනි දෑ විසි කිරීම මඟින් කාණු පද්ධති අවහිර වේ.

කැළිකසල වැඩිවීම ,මං මාවත් ජලයෙන් යට වීමට හේතු ඇති කරයි. ගංගා පවිත්‍රව තබා ගැනීම සඳහා ඔබ ඔබගේ පාසල් මිතුරන් , ගුරුවරුන්, පවුල්වල අය, ප්‍රාදේශීය සභා හා ප්‍රජා නායකයන් එකට එක්කර ව්‍යාපෘතියක් සංවිධානය කළ යුතු වේ.

මෙය අවදානම් වළක්වා ගැනීම සඳහා මෙන්ම ආපදා අවම කර ගැනීම සඳහා යහපත් ව්‍යාපෘතියක් වේ. ඔබ සියල්ලන්ම එකට එක්වී වැඩකිරීම හා ඔබ එක්රැස් කරන ලද කැළිකසලවල ඡායාරූප ගැනීමෙන් අන් අයට පෙන්විය හැකිය.

මෙවැනි ඡායාරූප මගින් ප්‍රදර්ශනයක් පැවැත්වීමට ඔබේ වැඩිහිටියන්ගෙන් උදව් ලබා ගත හැක. මෙවැනි ප්‍රදර්ශන ඔබේ පාසලේ, නගර ශාලාවේ, ප්‍රාදේශීය සභා ගොඩනැගිලිවල හෝ මහජන පුස්තකාලයක ප්‍රදර්ශනය කිරීම මගින් ගංගාවෙන් ඔබ එකතු කළ කැළිකසල ප්‍රමාණය පිළිබඳව සියල්ලන්ම දැනුවත් කළ හැක. එවිට ගංගාව පවිත්‍රව තබා ගැනීම ලොකු කුඩා කාගේත් වගකීමක් බව පෙන්වා දිය හැක. එමඟින් ගංගා පවිත්‍ර කර ගංවතුර හා පරිසර හානිය වළක්වා ගනිමු.

පරිසර සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම....

කපා දමන ගස් ප්‍රමාණය වැඩි වීම තද වැසි හා නායයෑම්වලට ගොදුරු වීමේ හැකියාව වැඩි කරයි. ඔබගේ පාසලේ හා ප්‍රජාවගේ දායකත්වය ඇතිව පළාත් පාලන ආයතන සමඟ රුක්රෝපණ වැඩසටහන් සංවිධානය කරන්න. සිටවන ශාක වර්ග ඔබේ ප්‍රදේශයට හා රටට ආවේණික බව පිළිබඳව සැලකිලිමත් වන්න. මේ අයුරින් ඔබ පරිසරය ආරක්ෂා කිරීමට, නායයෑම් හා පාංශු ඛාදනය වැළැක්වීමට උපකාර කරයි.

අනෙක් අයත් සහභාගී කර ගෙන වෙනසක් ඇති කරමු.

සම්පත් විවිධ ලෙස භාවිත කිරීමට ඔබේ යහළුවන්, පවුලේ අය හා පංතියේ ළමුන්ව දිරිමත් කරන්න. ඔවුන්ට ශක්තිය ඉතිරි කිරීමට, ජලය පරිස්සමින් පරිහරණය කිරීමට, බැහැර කරන කසළ ප්‍රමාණය අවම කිරීමට උදව් කරන්න.

ඔබ ශක්තිය ඉතිරි කරන ආකාරය ඔවුන්ට පෙන්වුවහොත් ඔවුන් ඔබව අනුගමනය කරාවි.

- පරිහරණය නොකරන අවස්ථාවලදී විදුලිබල්බ නිවා දමන්න.
- කවුරුන් හෝ රූපවාහිනිය නැරඹීම සිදුනොකරන විට එය ක්‍රියා විරහිත කරන්න.
- දිවා කාලයේ දී ඔබේ පාසලෙන් දෙන ලද ගෙදර වැඩ අවසන් කිරීමට පුරුදු වන්න.

ඔබ බැහැර කරන කැළිකසල ප්‍රමාණය අඩු කරන්න.

- ඇසුරුම් නැවත නැවත පාවිච්චි කරන්න. (ප්ලාස්ටික් හා පොලිතින්)
- වැඩි ඇසුරුම් ප්‍රමාණයක් සහිත නිෂ්පාදන මිලදී ගැනීම මගහරින්න.
- හැකි සෑම විටම කඩදාසි නැවත නැවත පාවිච්චි කරන්න.

ජලය ඉතිරි කරන්න.

- අනවශ්‍ය ලෙස විවෘත කර ඇති ජල කරාම වසා දමන්න.
- නගරයේ ජල කාන්දුවක් දුටු විට එය නගර සභාවට, ප්‍රාදේශීය සභාවට හෝ ජල සම්පාදන මණ්ඩලයට දැනුම් දෙන්න.
- ඔබ දත්මදින විට ජල කරාමය වසා දමන්න. නාන විට ජලය නිකරුනේ අපතේ නොයවන්න.

පරීක්ෂණය: සුළියක් නිර්මාණයක් කරමු.

අවශ්‍ය දේවල් :

- එකම ප්‍රමාණයේ විශාල ප්ලාස්ටික් බෝතල් දෙකක්
- ගම් ටේප්
- ජලය වර්ණ ගැන්වීමට - තීන්ත, සායම් හෝ කලරින්

උපදෙස්:

- එක් බෝතලයකින් භාගයක් පිරෙන තරමට ජලය එක්කර වර්ණ යොදන්න. බෝතල් දෙකෙහි කටවල් එක මත එක තබා හොඳින් ටේප් අලවා ගන්න. ජලය පිටව නොයන ලෙස හොඳින් අලවා ගන්න.

- හොඳින් සවි වූ බෝතල් දෙක, ජලය බෝතලය වටා යන ආකාරයට සොලවන්න. ජලය වේගයෙන් සෙලවෙන විට හිස් බෝතලය මේසයක් හෝ පුටුවක් වැනි මුහුණතක් මත තබන්න.

- දැන් ඉහළ ඇති බෝතලයේ ජලය පහළට ගමන් කරන ආකාරය දැකිය හැකිය. එක් බෝතලයකින් අනෙක් බෝතලයට ජලය ගමන් කරන ආකාරය ටෝර්නඩෝ එකක හෝ හරිකේන් එකක ඇති වන සුළියට සමාන වේ. නමුත් එහි ජලය වෙනුවට ජල වාෂ්ප වලින් පිරුණු වාතය අඩංගු වේ.

ආපදා අවම කිරීම පාසලේ දීම පටන් ගනිමු.

ආරක්ෂිත පාසැල් ගොඩනැගීම



- ආරක්ෂිත පාසලක් ආරක්ෂිත ස්ථානයක ගුණාත්මක බවින් වැඩි ද්‍රව්‍ය යොදාගෙන නිවැරදි ක්ෂේත්‍රයන්ට අනුකූලව ඉදිකරනු ලබයි. මෙහිදී එම ප්‍රදේශයට, එහි ජීවත් වන මිනිසුන්ට විශේෂිත වූ ගුණාංග ඇතුළත් කළ හැක.

ආපදා අවදානම අවම කිරීම පාසලේදී ආරම්භ කිරීමට නම්.

- අධ්‍යාපනයෙහි නියැලෙන සිසුන් හා අනෙකුත් අධ්‍යයන ප්‍රජාව ආරක්ෂා කිරීමට නම් අධ්‍යාපන මධ්‍යස්ථානය, භූමි කම්පා, චණ්ඩමාරුත හා කුණාටු ආදී ආපදා සඳහා ඔරොත්තු දිය යුතුය.

- ආපදාවකදී අවතැන් කඳවුරු ලෙස යොදා ගන්නා පාසල් මේ සඳහා උදාහරණ ලෙස ගත හැක. පළාත් පාලන ව්‍යුහ මෙන්ම මිනිසුන්ද නිවාස, කාර්යාල, කර්මාන්තශාලා, සෞඛ්‍ය මධ්‍යස්ථාන හා කඩ සාප්පු පාසල මෙන්ම ආරක්ෂිතව ඉදිකිරීමට අවශ්‍යය වේ.

- හොඳින් නඩත්තු කරන ලද පාසලක් එහි සිසු දරු දැරියන්ව ආරක්ෂා කරන අතර ආපදාවකින් පසුවද අඛණ්ඩව අධ්‍යාපන කටයුතු සඳහා ඉඩ ලබා දේ.

- ගොඩනැගිලි කාලයත් සමඟ හානියට පත්වේ. දිනපතා පරිහරණය කරන පාසලේ යටිතල පහසුකම්ද හානියට පත් වේ. විදුලි උපකරණ ක්‍රියා නොකිරීමට පටන් ගනී, වහලයෙහි කාන්දුවීම් ඇති වේ, ජනෙල් කැඩීයාම සිදුවේ. එලෙස පුංචි භූචලනයකට වුවද බිත්ති හා බිම පිපිරීම වැනි සුළු හානි සිදුවීමට හැකි අතර තද සුළඟකට වහලයේ සමහර කොටස් ගැලවී යාමේ හැකියාව ද පවතී.

- ආරම්භයේ දී ආරක්ෂිත ස්ථානයක පාසල ගොඩනැගීම මෙන්ම, එම ගොඩනැගිලි නඩත්තු කිරීමද ඉතා වැදගත් වේ. අපි පාසලේ යටිතල පහසුකම්වලට පරිහානියට පත්වීමට ඉඩ ලබා දේ නම් එය මුළු මහත් ප්‍රජාවටම අනාරක්ෂිත පාසලක් බවට පත් වේ.

පහත දක්වා ඇති පාසලේ අවදානම් ලෙස පවතින අඩුපාඩු 08 ක් හදුනාගන්න.



1...

2...

3...

4...

5...

6...

7...

8...

පාසැල් ආරක්ෂිත සැලසුම

ප්‍රජා හා පාසල් ආරක්ෂිත සැලසුම් අවදානම් වළක්වා ගැනීම හා ආපදා අවම කිරීමට හොඳ මූලාරම්භයක් වේ

එය කුමන ආකාරයේ සැලසුමක් විය යුතුද?

අපි අපේ දිනය සැලසුම් කරන විට අපි කුමන හෝ තැනකට යාමට අවශ්‍ය විට අප කෑමට ගන්නා දේ ගැන ලැයිස්තු ගත කිරීමක් මෙන්ම අපි කරන ක්‍රියාකාරකම් ගැනද තීරණය කළ යුතු වේ. මීළඟට අපි කාර්යයන් හා වගකීම් බෙදා ගැනීම සිදුකරයි. කුමුදු පාන් ගේනවා එයා බේකරියට ආසන්නයේ ඉන්න නිසා, අයේෂා චීසුයි සලාද කොළයි ගේනවා, ප්‍රසන්නලාට පලතුරු කඩයක් තියන නිසා එයා බීමයි පලතුරුයි ගේනවා, අනිත් අය චාරිකාවට ඕන දේවල් හා ක්‍රීඩා කිරීමට අවශ්‍යය දේ ගෙනෙනවා. අපි බසයෙන් යන්නෙ කියන එක අමතක කරන්න එපා.

අපිට අවදානම් වළක්වා ගැනීමට හා ආපදා අවම කිරීමට අවශ්‍යය විට, සංවිධානය වී සැලසුමක් සකස් කිරීමට අවශ්‍යය වේ. එය අපි මුහුණ දෙන අවදානම්, අප විශ්වාසය තබන සම්පත් හා ධාරිතාවන් හඳුනා ගනී. ඒ වගේම අපි අපේ සැළසුම ක්‍රියාවට නංවන විට වගකීම් පැවරීම සිදුකරන්න පුළුවන්.

පාසල් ආරක්ෂිත සැලසුමක් සකසන්නේ කෙසේද?

1. සංවිධානය වීම

ආපදා අවම කිරීමට ප්‍රජාවේ සිටින පෙදරේරුවා, ගුරුවරයා, නගරාධිපති, සිසුන්, ඉංජිනේරුවන්, පරිසරවේදීන් හා ළමුන් යන සෑම අයෙකුගේම එකමුතුකම, සහභාගීත්වය හා සංවිධානය වීම අවශ්‍යය වේ. සෑම පුද්ගලයෙකුටම පරිසරය ගැන සැළකීමේ දී හා ආපදා අවම කිරීමේදී තමන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට ගන්නා තීරණවලට සහභාගී වීමට අයිතියක් ඇත.

ළමුන්ට මතයක් ප්‍රකාශ කිරීමට අයිතියක් ඇත.
එමෙන්ම වැඩිහිටියන් ළමුන්ට බලපාන
තීරණයක් ගැනිමේදී ළමුන්ගේ මතය ගැනද සැළකිලිමත් විය යුතුයි.

2. උවදුර, ගොදුරුවීමේ හැකියාව හා අවදානම හඳුනා ගැනීම

01. ඔබ පියවරක් ගැනීමට පෙර ඔබ කිරීමට යන දෙය ගැන පැහැදිලිතාවක් තිබිය යුතුයි.

- පළමුවෙන්ම ඔබට, උවදුර ස්වභාවිකද, මිනිසා විසින් සිදුකරන ලද දෙයක් ද යන්න පිළිබඳව දැන ගැනීමට සිදු වෙනවා.
- මෙම උවදුරුවලට ඔබ ගොදුරු වුයේ කවදාද කොහොමද යන්න හඳුනා ගත යුතුයි.
- ඔබ ඔබේ ගොදුරුවීමේ හැකියාව තක්සේරු කිරීමේ දී ඔබ සතු ධාරිතාවයන් හා සම්පත් පිළිබඳව හඳුනාගත යුතුයි.

02. අවදානම් වළක්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග පැහැදිලි කිරීම්

- ඔබ උවදුරු ගොදුරුවීමේ හැකියාව හා ධාරිතාවය හඳුනාගත් පසු ඒ සඳහා ඔබ ගත යුතු ආපදා වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ග තීරණය කිරීමට කාලය එළඹෙයි. වළක්වා ගැනීම යනු අවධානම මගහැරීම සඳහා ඔබ සිදුකරනු ලබන දෙයයි. අවදානම පවතින අවස්ථාවකදී ආපදාවක් සිදුවී මෙන් විශාල හානියක් වළක්වා ගැනීමේදී ඔබ එය පාලනය කිරීමට කුමක් සිදු කරයිද?

03. සූදානම් වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාමාර්ග පැහැදිලි කිරීම.

- සැම විටම ආපදාවක් මග හැරිය නොහැකි නමුත් ඉන් සිදුවන බලපෑම අඩු කළහැක. ඔබ ජීවත්වන ප්‍රදේශය හේතුකොට ගෙන ස්වභාවික හෝ මිනිසා විසින් ඇතිකරන ලද උවදුරුවලට ඔබගේ පවුල සහ ප්‍රජාව නිරාවරණය වීමට හැක. සූදානම් වීම යනුවෙන් අදහස් කරනුයේ ආපදාවකදී විශාල පරිමාණයෙන් ජීවිත අහිමිවීම් හා වෙනත් හානි මග හැරීමට ඔබ ගනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයකට වේ. ඔබ විශාල සමාජයක කොටසක් නිර්මාණය කරන බැවින් ආපදාවකට සූදානම් වීමට හොඳම ආරම්භක ස්ථානය ඔබගේ පවුල හා පාසල වේ. සූදානම් වීම් ක්‍රියාත්මක කිරීමේදී ළමුන්ගේ සහභාගීත්වය හා අදහස් ඉතා වැදගත් වේ.

04. සැලසුම් ක්‍රියාමාර්ගයෙහි යෙදවීම

ඔබට සැලසුම් හා ක්‍රියාමාර්ග අභ්‍යාසයෙහි යෙදවීමට ඒවා ප්‍රගුණ කිරීමට සිදුවේ. මෙම පියවර, ඔබ ඔබගේ පාසල හා ප්‍රජාව ඔබ සැලසුම් කරන ලද කාර්යයන් මොනවාද, ඒවා වැඩි දියුණු කිරීමට අවශ්‍යය තැන් මොනවාද යන්න පිළිබඳව දැන ගත හැක.

05. සැලසුම් යාවත්කාලීනව තබා ගැනීම

- අඩුම වශයෙන් සැලසුම් වසරකට වරක්වත් ප්‍රතිශෝධනය කළ යුතුයි.

පාරිභාෂික පද.

පසු කම්පනය : සාමාන්‍යයෙන් විශාල භූචලනයකට පසු සිදුවන පොළොව සෙලවීම්. මෙම කම්පනයන්ට ද හේතුවන්නේ මුල් භූ චලනයට තුඩුදුන් හේතුන්මය.

ආපදාව : ප්‍රජාවක් මත පතිත වූ උපද්‍රවයක හානිකර ප්‍රතිඵල විපත ලෙස හැඳින්වේ. විපතක ප්‍රතිඵල රඳා පවතින්නේ යම් උපද්‍රවයකට සාපේක්ෂව ප්‍රජාවකගේ ගොදුරුවීමේ හැකියාව (පාත්‍රතාව) හා ඊට ප්‍රතිචාර දැක්වීමට ප්‍රජාවගේ ශක්ති ප්‍රමාණය මතය.

ආපදා වැළැක්වීම : උපද්‍රවයක් විපතක් බවට පත්වීම වැළැක්වීමට ගැනෙන පියවර.

නියඟය : යම් ප්‍රදේශයකට වර්ෂාව නොලැබී පවතින කාල සීමාව (මාස හෝ වසර ගණනා-වක්). මෙම තත්ත්වය නිසා පස, භෝග වගාවන් හා සතුන් සහ සමහර විට මනුෂ්‍යයන් වෙත ද මරණය ඇතුළු බරපතල හානි සිදු වේ.

භූ චලනය : පෘථිවි අභ්‍යන්තරයේ ගැඹුරේ සිට හට ගන්නා සෙලවීම් හේතුවෙන් පෘථිවිය මතුපිට ඇති වන ප්‍රචණ්ඩකාරී සෙලවීම්/කම්පන.

එල් නීනෝ/ලානීනා : වසර කිහිපයකට වරක් සිදුවන කාළගුණ වෙනස. සමකය අසල පිරු හා ඉක්වදෝර වෙරළට ඔබ්බෙන් පැසිපික් සාගරයේ මතුපිට ජලය සාමාන්‍ය කාලයට වඩා උණුසුම් හෝ සිසිල් වූ විට මෙම වෙනස සිදුවේ. මෙම කාළගුණ වෙනස හේතු කොට ගෙන සමස්ත ලතින් ඇමරිකාවේ හා ලෝකයේ වෙනත් ප්‍රදේශවලද ජල ගැලීම්, නියඟයන් වැනි ආන්තික කාළගුණ තත්ත්වයන් ඇති විය හැක.

හදිසි අවස්ථා කට්ටලය : හදිසි අවස්ථාවක් ඇති වුවහොත් තමන් සමඟ ගෙන යෑමට සෑම පවුලක් විසින්ම සූදානම් කර තබාගත යුතු පෙට්ටියක් හෝ උරයක්, කල් තබා ගත හැකි ආහාර, පානීය ජලය, ඇඳුම්, විදුලි පන්දමක් හා බැටරි, අතේ ගෙන ගිය හැකි ගුවන් විදුලි යාන්ත්‍රනයක් හා ප්‍රථමාධාර කට්ටලයක් ද මීට ඇතුළත් විය යුතු ය.

ඛාදනය : ධාරාණිපාත වර්ෂාව, සුළං හා වැරදි භූමි පරිභෝජන ආදිය නිසා පස නිරතුරුවම සෝදාගෙන හෝ ගෙවී යාම.

ගිනි ගැනීම: ඔක්සිජන්, තාපය හා දැවෙන සුළු ද්‍රව්‍යයක එක්වීමෙන් සිදුවන රසායනික ප්‍රතික්‍රියාවක්.

ජලගැල්ම: සාමාන්‍යයෙන් තද වර්ෂාව හේතුකොට ගෙන, පසට දරාගත නොහැකි අති විශාල ජලස්කන්ධයක් ඒකරාශි වීම.

උවදුරු: නිසි සූදානම් වීමක් නොමැති නම්, ජන කණ්ඩායමකට, ඔවුන්ගේ දේපළවලට හා පරිසරයට හානි සිදු කළ හැකි, ස්වභාවිකව හෝ මිනිස් ක්‍රියාකාරීත්වයන් නිසා ඇතිවන යම් සංසිද්ධියක්. නිදසුනක් දැක්වුවහොත්, යමකු යමහලක් සමීපයේ ජීවත් වේ නම්, එහි සිදුවිය හැකි පිපිරීම් උවදුරක් වේ. ඒවා වසර ගණනාවකට සිදු නොවුවත් උවදුරක් වේ.

හරිකේන් කුණාටු: සාගරයට උඩින් ආරම්භ වී, විශාල වෘත්ත වශයෙන් කරකැවෙමින්, වර්ෂාව ගෙන එන ප්‍රචණ්ඩකාරී සුළං. මේවා නිවර්තන සුළිසුළං හා ටයිෆුන් වශයෙන් ද හැඳින්වේ. සමක ප්‍රදේශවල මේවා 80 ක් හා 100 ක් අතර සංඛ්‍යාවක් වසරක් පාසා සිදුවේ. අත්ලාන්තික් සාගරික හරිකේන් සමය ජුනි 1 වන දා ආරම්භ වී නොවැම්බර් 30 අවසන් වේ. ඊශාන දිග පැසිෆික් කලාපයේ එය මැයි 15 ආරම්භ වී නොවැම්බර් 30 අවසන් වේ.

නායයෑම්/මඩ ගැලීම්: පස ප්‍රමාණවත් ලෙස ස්ථාවර නොවන නිසා පස්, ගල් හා වෘක්ෂලතාදියේ සුන්බුන් හදිසියේම හෝ ක්‍රමක්‍රමයෙන් බෑවුමක් දිගේ පහළට පැමිණීම. ධාරාණිපාත වර්ෂාව හෝ භූ චලන හෝ ගිනිකඳු පිපිරීම් නිසා මේවා සිදුවිය හැක. නුසුදුසු ස්ථානවල නිවාස සෑදූ විට හා ගස් කපා දැමීමෙන් පස එක්කර තැබීම වැළකෙන නිසා, තද වැසි වලදී අවදානම අධික වේ.

අවම කිරීම: උවදුරුවලට ගොදුරු වීමේ හැකියාව අවමය කිරීමට ගැනෙන පියවර.

වසංගත: කෘමීන් හෝ වෙනත් සතුන් අති විශාල රෑන් වශයෙන් නගරයක් හෝ ප්‍රජාවක් මත පැමිණීමෙන් ජනතාවට හා වගාභෝගවලට සිදුවන හානිය.

අවදානම: භූ චලයනයක්, කුණාටුවක් වැනි උපද්‍රවයක්, බරපතළ ආර්ථික, සමාජීයය හා පාරිසරික හානියක් සිදු කළ හැකි විපතකට පෙරැලීමේ සම්භාවිතාව.

අවදානම් කළමනාකරණය: උවදුරක් විපතක් බවට පෙරැලීමට ඉඩ නොදීමට ප්‍රජාවකට ඇති හැකියාව.

අවදානම් ස්ථාන පෙන්වන සිතියම: පාසැල්, රෝහල්, නගර ශාලා යනාදී ප්‍රධාන ගොඩනැගිලි හා ගොවි බිම් හා උද්‍යාන යනාදිය පෙන්වන චිත්‍රයක් හෝ ආදර්ශනයකි. ගංගා හා වෙනත් ජලගැලීම් ප්‍රභවයන් හා ගිනිකඳු යනාදි අනතුරුදායක ස්ථාන ද එහි දැක්වේ. එම ස්ථාන කොතෙක් දුරට උපද්‍රවවලට භාජනය විය හැකි දැයි (මඳක්, බොහෝදුරට, සම්පූර්ණයෙන් විනාශ විය හැකි ද) ඉන් දැක්වේ.

තිරසාර සංවර්ධනය: අනාගත පරම්පරාවන් අනතුරට භාජනය නොවන පරිදි වර්තමාන අවශ්‍යතාවන් සපුරා ගන්නා සංවර්ධනය වෙනත් වචනවලින් පැවසුවහොත්, ස්වභාව ධර්මය මනුෂ්‍යයාට අනතුරක් නොවන ලෙසට හා මනුෂ්‍යයා ස්වභාව ධර්මයාට අනතුරක් නොවන ලෙසට සංවර්ධන කටයුතු සිදු කිරීම.

භූ කම්පන ක්‍රියාවන්: පෘථිවිය සෙලවීම්, භූචලන හා සුනාමි වැනි සංසිද්ධීන් ජනිත කිරීමට හැකියාව ඇති පෘථිවි අභ්‍යන්තරයේ කම්පන.

ටෝර්නාඩෝ: පුනීලයක ආකාරයෙන් පොළොව දිගේ ගමන් කරන අති ප්‍රචණ්ඩකාරී කරකැවෙන සුළං විශේෂයක්.

සුනාමි: භූ චලනයක් හෝ ගිනිකඳු පිපිරීමක් හෝ සාගරය යට සිදුවන නායයෑමක් හෝ නිසා සිදුවන යෝධ රැල්ලක් හෝ රැලි මාලාවක්.

ගිනිකඳු පිපිරීම: පෘථිවි අභ්‍යන්තරයේ සිට ගිනිකඳු හරහා ලාවා, අළු හා විෂ වායුවර්ග පිටවීම හා පිපිරීම.

ගොදුරු වීමේ හැකියාව: උවදුරකට සංසිද්ධියකට ඔරොත්තු දීමට ජනතාවකට හෝ ප්‍රජාවකට ඇති නොහැකියාව, හෝ විපතක් සිදු වූ විටක, ඊට නිසි ලෙස ප්‍රතිචාර දැක්වීමට නොහැකි වීම.

ලැව්ගිනි: වනාන්තර, වනලැහැබ්, වෘක්ෂලතාදිය හා සත්ත්ව විශේෂයන් ද විනාශයට පත් කරන, පාලනය කළ නොහැකි ගිනි ජාලය. මෙම ගිනි ජාලා පාලනය කිරීමට දුෂ්කර නිසා, අති විශාල ප්‍රදේශ හරහා ව්‍යාප්ත වේ. ගිනි ජාලාවලට භාජනයවන වනාන්තර වර්ග හා වෘක්ෂලතා වර්ග අනුව මේවා කැලෑ ගිනි, ලඳු ගිනි, තණබිම් ගිනි යනාදි වශයෙන් හැඳින්වේ.

ආපදා තත්වයන් ඇතිවූ වහාම
ඒ පිළිබඳව
ආපදා කළමණාකරන මධ්‍යස්ථානයේ
හදිසි ඇමතුම් අංශය
දැනුවත් කරන්න

117

සටහන් :-

සටහන් :-

සටහන් :-